වීදාගම හිමියන් විරචිත

ලෝවැඩ සඟරාව

පිළිබඳ

ව්‍යාඛ්‍යානය

සංස්කාරක

වෛද්‍යාචාර්ය

පණ්ඩිත විද්‍යාභූෂණ ගුණදාස සෝමසිරි

ප්‍රකාශකයෝ

බැස්ටියන් පුත්‍රයෝ සහ සමාගම

කොළඹ

1955

මුද්‍රණය:—

සීමාසහිත පෙරමුණ යන්ත්‍රාලය

මරදාන—කොළඹ.

මිළ ශත -/50

වීදගම මාහිමියන්

විරචිත

ලෝවැඩ සඟරාව

පිළිබඳ

ව්‍යාඛ්‍යානය

1 සෙත් සිරි දෙන මහ ගුණ මුහු දණන්
ස ත් හට වන බව දුකට වෙ දණන්
ති ත් ගණ'ඳුරු දුර ලන දිනි දණන්
සි ත් සතොසින් නම දිම් මුනි දණන්

අන්වය: සෙත් සිරි දෙන මහ ගුණ මුහුදණන් සත්හට වන බව දුකට වෙදණන් තිත් ගණඳුරු දුරලන දිනිඳාණන් මුනිඳාණන් සිත් සතොසින් (මම) නමදිම්.

පදාර්ථය: සෙත් සිරි, නිවන් සැප; දෙන, දෙන්නාවූ; හගුණ මුහුදණන්, මහා ගුණයනට මුහුද වැනි වූ; සත්හට, ත්ත්වයාහට; වන, වන්නාවූ; බවදුකට, සංසාර දුකට; වෙද ණන්, වෙදදුරකු වැනි වූ; තිත් ගණඳුරු, තීර්ථක නමැති ගණාන්ධ ාරය; දුරලන, හරනා; දිනිඳාණන්, සූර්යයා වැනි වූ; මුනිඳාණන්, සර්වඥයන් වහන්සේ; සිත් සතොසින්, චිත්ත න්තෝෂයෙන්; (මම) නමදිම්, වඳිම්.

භාවාර්ථ: නිවන් සැප දෙන මහගුණයනට මුහුද වැනි වූද ත්ත්වයාහට ඇතිවන සසර දුකට වෙදකු වැනිවූ ද මිස දිටු ාමැති ගණ අඳුර දුරලන හිරු වැනිවූ ද මුනිඳාණන් සිත් සතොසින් මම වඳිමි.

විග්‍රහ: සෙත් සිරි, සෙත් හි වූ සිරි සෙත්සිරි; සෙත් යනු නිවණට නමි. ශාන්තිය, යහපත, යන අරුත්හිද වැටේ.

මහගුණ මුහුදණන්, බුදුහු මහගුණ මුහුදු වෙත්. නවලොවුතුරු ගුණ ආදිය මහා ගුණයෝය. ඒ හැම එක් රැස්වී මෙන් බුදුරජාණන් වහන්සේ මුහුදක් වැනිවෙති.

බව දුකට: බවෙහි දුක, බවදුක, එයට බවදුකට; මැරි මැරී ඉපදෙමින් අවසානය තෙක් සත්ත්වයා ගේ හැසිරීම භවයයි කියති. එහි දී ඇති වන ජාති ජරා ව්‍යාධි-ආදිය මහ දුක්ය.

වෙදණන්: රුජා හෙවත් දුක් සංසිඳුවීම වෙදහුගේ කාර්යයයි. බවෙහි ලැබෙන දුක් සංසිඳුවන වෙදහු බුදුහු මය.

තිත් ගණඳුරු: තිත්ථක සමූහ නමැති අඳුර "ලෝව බඹා මැවූයේය" යනාදි වශයෙන් මිථ්‍යා දෘෂ්ටි ගත් ආගම් කර්තෘවරු තිත්ථකයෝය.

දිනිඳණන්: දිනට ඉඳු=දිනිඳු. හිරුයි. බුදුහු තිත් ගණ අඳුරු දුරලන දිනිඳාණ කෙනෙකි. බුදුහුටද දිනිඳු නම යෙදේ.

ආක්ෂෙප: සෙත් සිරි දෙන මහ ගුණ කවරේ ද? බුදුහු එයට මුහුදු වනුයේ කෙසේ ද?

සමාධාන: අරහත් - සම්මා සම්බුද්ධ - විජ්ජාචරණ සම්පන්න සුගත - ලොකවිදූ - අනුත්තර - පුරිස දම්ම සාරථි - ශාස්තෘ - භගවත් යන මේ නව මහා ගුණවලින් හා වෙනත් අපමණ ගුණ රැසින් අනූන හෙයින් බුදුහු මහ ගුණයනට මහ මුහුද වැන්න.

2 ඇ ම ප ම ණින් පැවසූ මුනි දැන තතු
මෙම හැම දෙන බලවයි දැක්විය යුතු
ත ම ත ම නැණ පමණින් දැන ගත යුතු
ම ම න ම දිම් සදහම්පහද සිතු

අන්වය: මුනි තතු දැන ඇම පමණින් පැවසූ මෙම හැම දෙන බලවයි දැක්විය යුතු තම තම නැණ පමණින් දැන ගතයුතු සදහම් සිත් පහද මම නමදිම්.

පදාර්ථය: මුනි, සර්වඥයන් වහන්සේ; තතු, ලෝක තත්ත්වය; දැන, අවබොධකොට; ඇම පමණින්, සියල්ලන්ගේ ප්‍රමාණයෙන්; පැවැසූ, ප්‍රකාශ කළාවූ; මෙම, මෙය; හැමදෙන බලවයි;

"සියළු ජනයෙනි බලව" යි දක්වියයුතු, දක්වීමට සුදුසු වූ; තම තම, තම තමන්ගේ; නැණපමණින්, ඥාණප්‍රමාණයෙන්; දැන ගත යුතු, දැන ගැනීමට තිසි වූ; සදහම්, සද්ධර්මය; සිතු, සිත; පහදා, පහන් කොට; මම, මම; නමදිමි, වඳිමි;

භාවාර්ථ: බුදුන් වහන්සේ සියල්ල දැන හැමගේ නුවණට පමණ වන සේ පැවසූ, "මෙහි විත් බලවයි" කැඳවා පෙන්විය හැකි සේ සත්‍ය වූ, තම තමාගේ නුවණින් පමණට දත හැකි වූ සදහම් සිත පහදා මම වඳිමි.

විග්‍රහ: ඇම = හැම, හකාර ලොපයෙන් "ඇම" යි සිටි. ඇමගේ පමණින්, ඇම පමණින්.

"**මෙම හැමදෙන** බලව" යි යන මින් දහමෙහි "**එහි පස්සික**" ගුණය දක් වූහ.

ආක්ෂෙප: සදහම් යනු කුමක් ද?

සමාධාන: බුදුන් දෙසූ නව ලොවුතුරු දහම සදහම වේ. එනම්: සෝවාන් – සකදාගාමි – අනාගාමි – අරහත් යන සතර මග හා සතර පලය යන අටත් නිබ්බාණයත් යන නවයයි. බුදුහු වදාළ ශ්‍රී මුඛ දෙශනාවද පර්‍යාප්ති වශයෙන් සදහම් නම්. ඒ සූත්‍ර– අභිධර්ම – විනය යි ත්‍රිපිටක වශයෙන් ත්‍රිවිධය.

3 සිරිමත් බඹ සිරසෙහි පා පිසි නා
සැරියුත් මහ මුගලන් පිළි වෙළි නා
පිළිවෙත් සරු මහ සඟගණ සොබ නා
මුදුනත් බැඳ නමදිමි බැති පෙමි නා

අන්වය: සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා සැරියුත් මහ මුගලන් පිළි වෙළිත් අං සොබනා පිළිවෙත් සරු මහ සඟ ගණ බැති පෙමිනා මුදුනත් බැඳ නමදිමි.

පදාර්ථ: සිරි මත්, ශ්‍රීමත් වූ; බඹ, බ්‍රහ්මයන්ගේ; සිරසෙහි, හිසෙහි; පා, ශ්‍රීපාදයන්; පිසිනා, ස්පර්ශ කරන්නා වූ; සැරියුත් මහ මුගලන්, සැරියුත් මහ මුගලන් යන අගසව් දෙදෙනා වහන්සේගේ; පිළිවෙත් සරු, ප්‍රතිපත්ති සාර වූ; මහසඟගණ, මහාසංඝ සමූහයා; බැති පෙමිනා, භක්තියෙන් හා ප්‍රේමයෙන්; මුදුනා, මස්තකයෙහි; අත් බැඳ, දෑත් බැඳ ගෙන; නමදිමි, වඳිමි.

විග්‍රහ: බමු ගේ සිරසෙහි - බඹ සිරසෙහි,

පිළිවෙලින් + අං පිළිවෙලිනා; මුදුන + අත් බැද= මුදුනත් බැද,

භාවාර්ථ: මහා බඹුන් පවා නමදනා පා ඇති සැරියුත් මුගලන් පිළිවෙළින් පැවත අා ප්‍රතිපත්තින් සාර මහා සංඝ සමූහයා භක්තියෙන් ප්‍රේමයෙන් මුදුන අත් බැද නමස්කාර කරමි.

ආක්ෂේප: බඹ සිරසෙහි පා පිසින්නෝ කවරහුද? එසේ කීමෙන් කුමක් හැඟේ ද?

සමාධාන: සැරියුත් මුගලන් යන බුදුහු අගසව්වන් දෙනම ප්‍රධාන මහා සංඝ රත්නය බඹුන් ගෙන් වැඳුම් පිදුම් ලබන හෙයින් එසේ කීහ.

ආක්ෂේප: මහ සඟගණ කවරෙක් ද?

සමාධාන: සෝවාන් ඈ සතර මග සතර ඵලයට පත් අෂ්ට විධ ආර්‍ය පුද්ගලයෝය.

4 මන රම් නරදම් සැරි දම් සඟන ට
මෙලෙසින් බැතියෙන් අදරින් නම කො ට
වෙසෙසින් පෙළ දම් නොමදත් දන හ ට
පව සම් කළ කම් පල දූන් හෙළු කො ට

අන්වය: මනරම් නරදම් සැරිදම් සඟනට මෙලෙසින් බැතියෙන් අදරින් නමකොට වෙසෙසින් පෙලදම් නොම දත් දනහට කළ කම් පල හෙළුකොට දූන් පවසම්.

පදාර්ථ: සුබෝධයි.

මනරම් = මනෝරම්‍ය, නරදම් සැරි = බුදුන්, නමකොට = වැඳ; පෙල දම් - පාලි ධර්මය; කම්පල - කර්ම ඵලය, හෙළුකොට = සිංහලයට පෙරළා,

භාවාර්ථ: මනෝරම්‍ය වූ බුදු-දම්-මහසඟ යන තුනුරුවනට මෙසේ භක්තියෙන් ආදරයෙන් වැඳ විශෙෂයෙන් මැ පාලිධර්මය නොදත් ජනයා හට කළ කම් ඵලය හෙළ බසින් දූන් කියමි.

විග්‍රහ: නරදම්සැරි = දමනය කළයුතු පුද්ගලයන් දමනය කොට නිසි මඟ යොදවන හෙයින් බුදුහු නරදම්සැරි නමට හිමි වෙති. නරදම් සැරි ගුණය බුදුන් කෙරෙහි පිහිටි නව මහාගුණ සමූහයෙන් එකකි.

පෙළදම්: පයඹ්ප්තික ශ්‍රී බුද්ධ පාලි ධර්මය යි. බුදුන් දෙසූ මේ දහම සූත්‍ර - අභිධර්ම - විනය යයි තෙ කොටසකට බෙදූ එයට තෙවළා හෙවත් ත්‍රිපිටක යයි කියනු ලැබේ.

5 දහමට සරිකොට එළුවෙන් පෙරකී
කවියට සිත පහදා සිට නිසැකී
සිහිකොට කඳ පිළිවෙල දෙස් නොයෙකී
නිවණට සපැමිණී සඟ සැට නමකී

අන්වය: පෙර දහමට සරිකොට එළුවෙන් කී කවියට නිසැකී සිත පහදා සිට කඳ පිළිවෙල නොයෙක් දෙස් සිහිකොට සඟ සැට නමක් නිවණට සපැමිණී.

පදාර්ථ: සුබෝධයි. සරිකොට = සමාන කොට, එළුවෙන් = හෙළ බසින්, නිසැකී = සැක රහිත වැ; කඳ පිළිවෙළ = පංචස්කන්ධ පටිපාටියෙන්;

භාවාර්ථ: ඉහත දහමට සමාන කොට හෙළ බසින් කියූ කවියට නිසැකයෙන් සිත පහදා ගෙන– වේදනාදි පංචස්කන්ධ යන් ගේ පිළිවෙලින් නොයෙක් දෙස් සිහි පත් කර මහා සඟන හැට නමක් නිවණට පැමිණී යහ.

විග්‍රහ: කඳ පිළිවෙල දෙස්=රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යයි ස්කන්ධ පසකි. මේ පසින් සත්ත්වයා සැදී සිටී. සත්ත්වයා ලබන ජාති ජරා ව්‍යාධි මරණ ආදී දුකට පත්වීම් පස් කඳ නිසා ලබන දෙස් ය.

පෙර ලක්දිව විල්රකිත කතක් හා පලා නෙලන යුවතියක් අතර කියැවුන කවි කීපයක් අසා සිටි මහා සඟන සැට නමක් අනිත්‍යය මෙනෙහි කර රහත් වූහ. ඒ සිද්ධිය මේ පද්‍යයෙහි සඳහන් වේ. පාලියෙන් නොකියා හෙළයෙන් කියන බුදු බණින් වුව ද වැඩ සාදා ගත හැකි බැව් මෙයින් හඟවත්.

6 එ බැ වින් එළුවෙන් කිවැයි අනා දර
නොවමින් බැතියෙන් අදරින් නම කර
සතොසින් ඇසුවොත් මෙදහම් මනා හර
සැබැ වින් සිදුවෙයි සගමොක් සිරි සර

අන්වය: එබැවින් එළුවෙන් කිවැයි අනදර නොවමින් බැතියෙන් අදරින් නමකර මනහර මෙ දහම් සතොසින් ඇසුවොත් සැබැවින් සගමොක් සිරිසර සිදුවෙයි.

පදාර්ථ: කිවැයි=කියුවේ යයි අනදර අනාදර (ආදර රහිත) නොවමින්=නොවෙමින් සගමොක්=දිව්‍යලොක සහ නිර්වාණ; සිරිසර=ඓශ්වර්‍ය්‍ය.

භාවාර්ථ: එනිසා හෙළ බසින් කියේ යයි ආදරය නැති කර නොගෙන භක්තියෙන් හා ආදරයෙන් වැඳගෙන සිත් ගත්නා සුලු මේ සදහම් සතොසින් ඇසුවොත් සැබැවින් මැ දිව සැපත් හා නිවන් සැපත් අත්වනු නිසැකැයි.

විග්‍රහ: අනදර (න+අදර) සග මොක් සිරිසර සග ද මොක් ද සගමොක් එහි සිරිසර සගමොක් සිරිසර.

ආක්ෂෙප: එළුවෙන් කීම අනාදරයට හේතු වන්නේ ද?

සමාධාන: නොවේ. දහම ලියවී ඇතියේ පාලියෙනි. එය හෙළ බසින් එනම් කවියට නගා කීමත් ලිමත් එද ඇතැම් විට ආදරය අඩුවීමට හේතුවිය හැකි ය. එනිසා වීදාගම හිමියෝ මූල කවියෙන් හෙළු කවි අසා ගෙන සිත පහදා ගත් භික්ෂූන් හැට නමකට මොක් සැප ලැබුන සැටි ද පවසා භක්ත්‍යාදරයෙන් මේ කවි ඇසුවොත් යහපත් ප්‍රතිඵල ලැබෙන බව කියූහ. මින් අසන්නන් ගේ භක්ත්‍යාදරය වර්ධනය කරති.

7 බි ම ඉඳ සිට කී බණ නාස න්නේ
පි ම තිව උඩ හිඳ සිට නාස න්නේ
කැම තිව කීවොත් විමසා'ස න්නේ
එ ම වඳ සග මොක් සැප සාද න්නේ

අන්වය: සිට කී බණ බිම ඉඳ නාංසත්තේ. සිට විමතිවැ උඩ සිඳ නාංසත්තේ. කැමතිවැ කීවොත් විමසා අසත්තේ. එම වද සග මොක් සිරි සාදත්තේ.

පදණි: සුබොඬයි.

භාවාණි: හිටගෙන කියන බණ බිම වාඩිවී නො අසතු. හිටගෙන කියන බණ සිත වෙනතක යොමාගෙන උඩක හිඳ නො අසතු. බණ ඇසීමේ ආශාවෙන් කීවොත් විමසීම් සහිතව අසන්න. එසේ ඇසීමෙන් සග මොක් සැප සාද ලයි.

විග්‍රහ: න + අසත්තේ = නාංසත්තේ.
විමසා + අසත්තේ = විමසාසත්තේ.

ආක්ෂෙප: කෙසේ බණ ඇසිය යුතු ද?

සමාධාන: දහම් දෙසන්නා හිටගෙන කියන බණ බිම වාඩිවී ඇසීම නො මැනැවි. උඩ වාඩිවී ඇසීම ද හොඳ නැත. සිත විමතියෙන් හෙවත් වෙන හැඟීම් ගැන සිත යොදා ගෙන බණ ඇසීම ද නිෂ්ඵලය. මෙයින් දුරුව බණට සිත නමා සාවධාන ව විමසිලි සහිතව බණ ඇසීම එල ලැබීමට හේතු වේ.

8 සියල් සසර දුක් දුරුකර නොයෙකී
අසල් කරන මොක් සිරි සැප නිසැකී
සියල් සතුනි පින් කරවයි මුනිකී
නොකල් අටෙකි පින්කම් කළ නොහැකී

අන්වය: සියල් සතුනි නොයෙකී. සියල් සසර දුක් දුරු කර මොක් සිරි සැප නිසැකී. අසල් කරන පින් කරවයි මුනිකී. පින්කම් කළ නො හැකි නොකල් අටෙකි.

පදණි: නොයෙකී, නොයෙක් අත්දමින්; අසල් කරන, ළං කරන; නො කල්, අකාල;

භාවාණි: සියලු සසර දුක් නා නා අයුරින් දුරු කොට නිවන් සැප සැක නැතිව මැ ළං කරන බුදුන් වහන්සේ සකල සත්ත්වයෙනි! පින් කරවයි දෙසූහ. ඒ පින්කම් නො කළ හැකි කාල අටකි.

ආක්ෂේප: සසර නම් කිමෙක් ද?

සමාධාන: කාම - රූප - අරූප යන භවයන් ද පංච මහා ගති - චතුර්විධ යෝනි - සප්තවිඥාන ස්ථිතිය - නව සත්තාවාස - නව භවය යන මේ අට වැදෑරුම් ස්ථාන සසර නම්.

නොකල් අට: නිරය - තිරිසන් අපාය - ප්‍රේතලෝකය - පිටසක්වල - අඳ ගොළු බිහිරි ව ඉපදීම - අරූපී බ්‍රහ්මලෝක සතර හා අසඤ්ඤ සත්ත බඹලොව, මිථ්‍යාදෘෂ්ටිය, අබුද්ධෝත්පාද කාලය යනුයි.

9 සි තු ව ත් බිය කරවන අර ත රයේ
වැටුනොත් එක්සිය සතිසක් නි රයේ
බ ල ව ත් දුක් විඳිනෙය කර ද රයේ
ම ද කු ත් පිනකට නැත අව ස රයේ

අන්වය: සිතුවත් අරතරයේ බිය කරවන එක් සිය සතිසක් නිරයේ වැටුනොත් කරදරයේ බලවත් දුක් විඳිනේය. පිනකට මඳකුත් අවසරයේ නැත.

පදනි: සිතුවත්, සිතිම කළත්; අරතරයේ, දෘඪතරව..... එක්සිය සතිසක් නිරයේ, එකසිය තිස්හයක් නරකයන්හි;

භාවාර්ථ: සිතූ පමණින් දැඩිසේ බිය උපදවන එක්සිය තිස් හයක් නරකයන්හි වැටුනොත් ක්‍රෑරතර බලවත් දුක් විඳිනේය. එහෙයින් පිනකට මඳකුත් ඉඩක් නැත.

විග්‍රහ: එක් සිය සතිසක් = 136 ක්.

ආක්ෂේප හා සමාධාන:

එක්සිය සතිස් නිරය.

සංජීවය	මහා රෞරවය
කාල සූත්‍රය	තාපය
සංඝාතය	ප්‍රතාපය
රෞරවය	අවීචිය

යන අට මහා නිරයත් ඒ හාත්පස පිහිටි ඔසුපත් නිරයයන් 128 ත් එක් වූ කල 136 ක් නිරයයෝ වෙති. (නිර් + අය) ඉමක් කොණක් නැති දුක් ඇතියෙන් නිරය නම් ලබයි.

10 තිරිසන් ජාතියෙ උපනත් පව් කො ට
අවසන් නොව බිය පවතී පිට පි ට
මඳ සන් සුන් කමකුත් නැත හැම වි ට
සලසන් නේ කෙලෙසද සිතු පින ක ට

අන්වය: පව් කොට තිරිසන් ජාතිය උපනත් අවසන් නොව බිය පිට පිට පවතී. හැමවිට මඳ සන්සුන් කමෙකුත් නැත. සිතු පිනකට සලසන්නේ කෙලෙස ද?

පදාර්ථ: උපනත්, උපන්නොත්; අවසන් නොව, කෙළවරක් නොවී; පිට පිට, නිතර නිතර;

භාවාර්ථ: පව් කිරීම් හේතුවෙන් තිරිසන් සත්ත්ව යෝනියෙහි උපන් හොත් ඉමක් නැති බිය නිතර ම පවතී කිසි කලෙක මඳ සන්සුන් භාවයක් වත් නො ලැබේ. පිනක් කිරීමට සිත යොදන්නේ කෙසේ ද? තිරිසන් ජාතියෙහි පින් දහම් කිරීමට නො හැකි හේතුත් මෙයින් විස්තර වෙයි.

11 උපනත් පේතව පව් කොට නොප ණත්
කලෙකත් නොලැබෙයි සෙම්සොටු පමණත්
උගුරත් නොතෙමෙයි සුරගඟ වැටු නත්
කලෙකත් පින් නොකළැකිමයි සිතු නත්

අන්වය: නොපණත් පව් කොට පේතව උපනත් කලෙකත් සෙම් සොටු පමණක් නො ලැබෙයි. සුරගඟ වැටුනත් උගුරත් නො තෙමෙයි. සිතුනත් කලෙකත් පින් නොකළැකි මැයි.

පදාර්ථ: නො + පණත්, ප්‍රඥප්ති ධර්මයෙන් වෙන් ව; (තහනම් කළ) පේතව, ප්‍රේතයෙක් ව; සුරගඟ, අහස් ගඟ; සිතුනත්, සිතුනේ වී නමුත්; කලෙකත්, කලකින් වුවත්; නොකළැකීමැයි, නො කළ හැක්කේ මැයි.

භාවය: බුදුන් පණවා වදාළ දහමින් වෙන්ව අකුසල් කොට ප්‍රේත ව උපන්නොත් කාලයකිනුත් සෙම් සොටු වත් නො ලැබේ. අහස් ගඟේ වැටුනත් පිපාසය සංසිඳුවා ගැනීමට උගුර තෙමෙන වතුරක් නො ලැබෙන්නේ ය. කලකින් පින් කරමි යි සිතක් පහළ වූවත් පින් නො කළ හැක්කේ මැයි.

12 පව් මිස පිනකැයි නොකරන හැම කල
මුනි බණ නො පවතිනා පිට සක් වල
තිසි ලෙස උපනත් ලැබ දන මන කල
කිසි කලෙකත් කුසලක් නොකළැකි බල

අන්වය; හැම කල පව් මිස පිනකැයි නොකරණ මුනි බණ නො පවතිනා පිට සක්වළ මන කල දන ලැබ තිසි ලෙස උපනත් කිසි කලෙකත් බල කුසලක් නො කළැකි.

පදාර්ථ: පව් මිස, පාපයක් මිසක්; පිට සක්වළ, මේ සක්වළින් පිට වෙනත් සක්වළයන්හි.

භාවාර්ථ: හැමදම පාපයන් විනා, පින්කම් යයි කියන දෙයක් නො කරණ බුදු බණ නොපවත්නා පිට සක්වළ දනය ඇතිව හොඳින් උපන්නත් බලවත් කුසලයක් කළ නොහැකි මැයි.

විග්‍රහ: පිටසක්වළ, මේ සක්වළින් පිට. එකම සඳ හිරු දෙදෙනෙකුගෙන් එළිය ලබනා පෙදෙස සක්වළකි.

ආක්ෂේප: පිට සක්වල උපන් කල කුසල් නො කළ හැකි මක්නිසා ද?

සමාධාන: බුදු පසේබුදු මහරහත් යන උතුමන් එහි නූපදනා හෙයින් සම්‍යක්දෘෂ්ටි ගත ධර්මානුශාසනා එහිදී නොලැබේ. අධර්මයට ම කැපවී කල් යැවීමට සිදුවන හෙයින් එහි පින් කිරීමට නො හැකි වේ.

13 ද ද මිනිසුන් බස් ගෙන කිසි කල කය
ත ද අකුසල් කොට කුසලින් වැළ කය
අ ද ගොළු බිහිරිව ලදුවත් මේ කය
ම ද පිනකුත් නොපිරෙයි බල නිසැ කය

අන්වය: කිසි කලකය දද මිනිසුන් බස් ගෙන කුසලින් වැළකය තද අකුසල් කොට අඳ ගොළු බිහිරිව මේ කය ලදුවත් නිසැකය බල මඳ පිනකුත් නො පිරෙයි.

පදාර්ථ: දද - මෝඩ වූ; නිසැකය = සැක රහිතව.

භාවාර්ථ: කිසියම් කාලෙක මෝඩ මිනිසුන්ගේ වචන පිළි ගෙණ පින් කිරීමෙන් වැලකී දරුණු පව් කොට අඳ-ගොළු-බිහිරවැ මේ ශරීරය ලැබූවත් සැකරහිත බලවත් වූ ස්වල්ප කුශලයකුත් නො පිරේ.

විග්‍රහ: අඳ ගොළු බිහිරි වැ = ඇස් නැති වැ කතා කළ නො හැකි වැ ඇසීම් රහිත වැ.

ආක්ෂෙප: අඳ ගොළු බිහිරි වූවන්ට පින් කළ නො හැකි ද?

සමාධාන: දැකීම - බිණීම - ඇසීම නොහැකි වුව ද පින් කිරීමට හැකිය. කුසලය වූකලි සිතිවිලි මාත්‍රයක් හෙයිනි. එසේ වුව ද බලවත් කුසල් කිරීමට එය බාධාවකි. එ නිසා මැ "බල මඳ පිනකුත් නො පිරෙයි" කීවේ ය.

14 සිත මිස කය නැති බඹ ලොව සත රෙකි
සිත නැති වම කය ඇති බඹ තල යෙකි
මෙද සත පින් කොට උපදින පෙදෙ සකි
එහි උපනත් කුසලක් නොම කළ හැකි

අන්වය: සිත මිස කය නැති බඹ ලොව සතරෙකි. සිත නැතිවම කය ඇති බඹතලයෙකි. මෙද සත පින්කොට උපදින පෙදෙසකි. එහි උපනත් කුසලක් නොම කළ හැකි.

පදාර්ථ: කය, ශරීරය; බඹ ලොව: බ්‍රහ්මලෝකය; මෙද, මෙය ද; සත, සත්ත්වයා;

භාවාර්ථ: සිත මිසක් ශරීරය නැති බ්‍රහ්ම ලොක සතරක් වෙයි. සිත නැති ශරරය පමණක් ඇති බ්‍රහ්ම ලෝක එකක් ද වෙයි. පින් කළ සත්ත්වයෝ මේ බ්‍රහ්ම ලෝක පසෙහි උපදිති. නමුත් එහි උපන් කල නැවත පින් කළ නො හැකිය.

විග්‍රහ:——·——

ආක්ෂෙප: සිත මිස කය නැති බ්‍රහ්ම ලෝක කිය ද? ඒ මොනවා ද? සතරකි. ඒ මෙ සේ ය.

සමාධාන: i. ආකාසානංචායතනය. ii විඤ්ඤාණංචායතනය. iii. ආකිඤ්චඤ්ඤායතනය. iv. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන මේ බඹ ලෝ සතර අරූපී බ්‍රහ්ම ලෝකයයි කියති. එහි ශරීරය නැත.

සිත පමණක් පවත්නෝ ය. (ඳ:) කය ඇති සිත නැති බඹ ලෝ කිය ද? ඒ කුමක් ද? (ස:) එකකි. ඒ රූපි බ්‍රහ්ම ලෝක නමින් ද කියවේ. **"අසඤ්ඤ සත්ත"** යනු එහි නාමයයි.

15 බලකොටු වන් තර මෙසසර නුව රේ
මුලැ ස වු වන් දලු ලන පව් පඳු රේ
වි ස ක ටු වන් සග මොක් මග අතු රේ
මි ස දි ටු වන් අයටත් පින් නොපි රේ

අන්වය: තර මෙ සසර නුවරේ බලකොටු වන් පව් පඳුරේ මූල දලුලන ඇසටුවන් සග මොක් මග අතුරේ විස කටු වන් මිසදිටුවන් අයටත් පින් නො පිරේ.

පදඅ: තර, මහත් වූ; මෙ සසර නුවරේ, මේ සසර නමැති නගරයෙහි; බලකොටුවන්, බලකොටුවක් වැනි; පව් පඳුරේ මූල, පාප නමැති පඳුරු මුල්හි; දලුලන, දලු දමන්නා වූ; ඇසටුවන්, ඇසටු ගසක් වැනි වූ; සග මොක්, සවර්ග මෝක්‍ෂ නමැති; මග අතුරෙ, මාර්ගය අතරෙහි; විස කටුවන්, විස කටුවක් වැනි වූ; මිසදිටුවන්, මිථ්‍යාදෘෂ්ටියට පැමිණි; අයටත්, අයවළුන් ටත්; පින් නො පිරේ. කුසල් සම්පූර්ණ නො වන්නේ ය.

භාවාර්ථ: මහත් සංසාර නමැති නුවරෙහි බලකොටුවක් වැනි වූ ද, පව් නමැති පඳුරු මුල්හි දලුලන්නා වූ ඇසටු ගසක් වැනි වූ ද, සවර්ගයට හා මෝක්‍ෂයට යන මාර්ගයෙහි විසකටු වැනි වූ ද, මිථ්‍යාදෘෂ්ටිය වැලඳගෙන සිටින අයටත් කුසල් නොපිරේ.

විග්‍රහ: මූල + ඇසටුවන් = මුලැ සටුවන්.

ආක්‍ෂේප: මිථ්‍යාදෘෂ්ටිය කුමකට උපමා කළ හැකි ද?

සමාධාන: (ඒ) මහා සංසාර නගරයේ බලකොටුවක් වැන්න. පව් පඳුරු මූල දලුලන ඇසටු ගසක් වැන්න. සග මොක් යන මග විස කටු වැන්න. වරද නිවරද වශයෙනුත් නිවරද වරද වශයෙනුත් ගෙන හැසිරීම මිථ්‍යාදෘෂ්ටියයි.

16 බුදු කෙනෙකුන් මේ ලොව නූපන් ව ර
අඳු රෙක්මය සදහම් නැති මෙසස ර
ඉඳු රා නොදනෙයි පව් පින් නො ර තු ර
සිදු නොකළැකි ඉන් සගමොක් සිරි ස ර

අන්වය: බුදු කෙනෙකුන් මේ ලොව නූපන්වර සදහම් නැති මෙසසර අඳුරෙක් මය. පව් පින් තොරතුර ඉඳුරා නො දනෙයි. ඉන් සග මොක් සිරි සර සිදු නො කළ හැකි.

පදාර්ථ: ඉඳුරා,ඒකාන්තයෙන් සිරිසර, ශොභා සම්පත්තිය;

භාවාර්ථ: බුදුන් වහන්සේ නමක් මේ ලොව නූපන් කල්හි මේ සංසාරය අන්ධකාර යෙක් මැයි. සද්ධර්මය නැති හෙයිනි. මේ පව යයි හෝ මේ පින් යයි නිශ්චය වශයෙන් නො දනේ. ඒ නිසා බුදු උපත නැති සමයෙක ඉපදීමෙන් සග මොක් සැප සිදු කළ නොගැක්කේය.

17 සැබැ වින් බණ ඇසූවොත් මුනිඳුන් කි
ගොළුවන් බිහිරන් සේ නොව සැල කී
ඉඳි නෙන් මිස නොප කුසලින් වැල කි
මෙලෙසින් පින් නොකළැකි කල් අටෙ කි

අන්වය: සැබවින් ගොළුවන් බිහිරන් සේ නොව මුනිඳුන් කී බණ සැලකී ඇසුවොත් නොප අකුසලින් වැලකී ඉඳිනෙන් මිස මෙලෙසින් පින් නොකළැකි කල් අටෙකි.

පදාර්ථ: සලකී; සැලකිලි සහිතව; ඉඳිනෙන් මිස ඉඳින හෙයින් විනා;

භාවාර්ථ: සවභාවයෙන් ගොළු බිහිරි වූවන් මෙන් නො සිට බුදු රදුන් වදාළ බණ සැලකිලි සහිතව ඇසුවොත් ; තොපට අකුසලින් වැළකී ඉඳීමට ඉඩ ලැබේ. එසේ නො කොට කුසල් සිදු කරගත නො හැකි වේ. පින් සිදු කළ නො හැකි කාල අටකි. ඒ යට කියන ලද අංකාරයෙන් දන්නේය.

විග්‍රහ: තොප + අකුසලින් = තොප' කුසලින්

ආක්ෂේප: පව් හා පින් නොකළ හැකි කාල කීයද? අටෙකි.

සමාධාන: නිරය; තිරිසන් ජාතිය; ප්‍රේත නිකාය; පට-සක්වළ; අඳ ගොළු බිහිරිවීම, අසඤ්ඤ සත්ත්වංසය,. මිසදිටුව,, අබුද්ධෝත්පාද කාලය, යනු ඒ අටය.

18 දිගු පුළුලින් සක් වළ වන්+ සිඳු කු ස
සිය වසකින් උඩ එන කැස් බා හි ස
විය සිදුරෙන් නැගෙනත් දුගතිය බැ ස
තව උපදින් නට බැරි මෙ මිනිස් කු ස

අන්වය: දිගු පුළු ලින් සක් වළ වන් සිඳු කුස සිය වසකින් උඩ එන කැස්බා හිස විය සිදුරෙන් නැගෙනත් දුගතිය බැස තව මෙ මිනි කුසස් උපදින්නට බැරි.

පදර්ථ: සිඳුකුස = සයුර ඇතුලෙහි; විය සිදුරෙන්, විය දඬු සිදුරකින්; දුගතිය, නිරයට.

භාවය: දිගින් ද පළලින් ද සක් වළ වැනි වූ සාගර පත්ලෙහි සිට වර්ෂ සියයකින් වරක් උඩ එන කණ කැස්බෑගේ හිස වියදඬු සිදුරකට එල්ල වී ඉන් උගේ එක් ඇසින් අහස දක්ම හැකිය. නරකයෙහි ඉපද නැවත මේ මිනිස් ලොව ඉපදීම එයටද වඩා අමාරුය.

විග්‍රහ:

ආක්ෂේප: සියවසෙකින් උඩ එන කැස්බෙක් මුහුදේ වෙසේද? වියදඬු සිදුරක් උගේ එක් ඇසට එල්ල වේද? මේ උපමාව කවුරුන් විසින් කුමක් සඳහා කියුවේ ද?

සමාධාන: නිරයෙහි උපන් සත්වයාට මිනිස් බවක් ලැබීම ඉතා අපහසු බැව් හැඟවීම සඳහා මේ ''කණ කැසුබු උපමාව'' බුදුහු වදාළහ. මේ උපමාවක් මිස මෙවැන්නක් ලොව ඇති නොවේ. එක් කණ කැසබුවෙකු මුහුදු පත්ලේ වාසය කරතැයි සිතමු. මේ සතා සිය වසකින් හෝ දහස් වසකින් උඩට එයි. පත්ලේ සිට දීර්ඝ කාලයකින් උඩට එන මේ මොහොතෙහි ම විය දඬු සිදුරක්ද උගේ එකම එක ඇසට හරියට එල්ල විය යුතුය. මේ විය දඬුව කුඹුරේදී කැඩීයාම නිසා ගොවියෙකු විසින් හැර දමන ලදුව එයින් ගඟටත් ගඟින් මුහුදටත් වැටී ඔබ මොබ පාවෙමින් තිබෙන්නකි. අපහසු ක්‍රියා ගැන මෙ උපමාව කියති

+ සක්වළ වල්, ඇතැම් පොතක.

19 කල කිනි බුදු කෙනෙකුන් උපදි න්නේ
දුක කිනි මිනිසත් බව ලැබ ග න්නේ
මෙදෙකිනි මෙ සසර දුක් දුර ල න්නේ
සුදනෙනි කිම වීරිය නොකර න්නේ

අන්වය; බුදු කෙනෙකුන් උපදින්නේ කලකිනි. මිනිසත් බව ලැබ ගන්නේ දුකකිනි. මෙ දෙකිනි මෙ සසර දුක් දුර ලන්නේ. සුදනෙනි!! කිම! වීරිය නො කරන්නේ.

පදාර්ථ: සුබොධයි.

භාවාර්ථ: බුදු කෙනෙකුන් උපදින්නේ දීර්ඝ කාලය කිනි. මනුෂ්‍යාත්ම භාවය ලබා ගන්නේ දුක සේය. මේ සංසාර දුකින් මිදීමට මේ දෙ කරුණ ම ලැබිය යුතු ය. සත් පුරුෂයෙනි ඇයි! උත්සාහ නොකරන්නේ.

විග්‍රහ: සුගමයි.

ආක්ෂෙප: මෙ සසර දුකින් මිදීමට අවශ්‍ය කරුණු දෙක කවරේ ද?

සමාධාන: බුද්ධොත්පාද කාලයත්, මනුෂ්‍යාත්ම භාවය ලැබීමත් ය.

20 පස් පව් කොට මෙ තැනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිති අනේ කය
රැස් කොට ඉන් පින් මෙ මිනිස් ලෝකය
සිස් නොකරව් කලෙකින් ලත් මේ කය

අන්වය: පස් පව් කොට මෙ තැනත් සෝකය ලැබ නිරයේ ගොස් අනේකය දුක් විඳිති. ඉන් මෙ මිනිස් ලෝකය පින් රැස් කොට කලෙකින් ලත් මේ කය සිස් නො කරව්.

පදාර්ථ: පස් පව්, පස් වැදෑරුම් අකුසල්; මෙ තැනත්; මේ ලෝකයෙහිත්; අනේකය, බොහෝ; මේ කය, මේ ශරීරය; සිස් නො කරව්, හිස් නො කරව්.

විග්‍රහ: පස් පව් = පව් පස. අනේකය = න + ඒක ය.

භාවාර්ථ: පස් පව් කර මේ ලෝකයෙහි දු ශෝකයට පැමිණ මරණින් මතු නරකාදියෙහි ඉපද නොයෙක් දුක් විඳිති. ඒ නිසා මේ මිනිස් ලොවෙහිදී පින් රැස් කරව්. කලකින් ලද මේ මිනිස් බව හිස් නො කරව්.

ආක්ෂෙප: පස් පව් මොනවා ද?

සමාධාන: සතුන් මැරීම, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම, සුරාපානය, යන පසයි.

21 කන් නන් මෙන් විස අඹ පල රිස්සේ
මන් සන් තොස් කර කිම පල සෙස්සේ
දූ න් දූ න් එයි මරුවා පසු පස්සේ
ඉ න් පි න් මය කටයුතු නම් දස්සේ

අන්වය: විස අඹ පල රිස්සේ කන්නන් මෙන් මන් සන් තොස් කර සෙස්සේ කිම පල දූන් දූන් මරුවා පසු පස්සේ එයි. ඉන් දස්සේ කටයුතු නම් පින් මය.

පදාර්ථ: විස අඹ පල, විස සහිත අඹ ගෙඩි; රිස්සේ, රිසි පරිද්දෙන්.

භාවාර්ථ: විස අඹ ගෙඩි රිසි පරිදි කන අය මෙන් පස්කම් සැපතින් සිත තුටු කර අන්‍ය කවර පලයක් ද? දූන් දූන් මරුවා පසු පස්සේ එයි. ඉන් දක්‍ෂ සේ කළයුතු පින් මය.

විග්‍රහ: ——

ආක්ෂෙප: විස අඹ පල නම් කිමෙක් ද?

සමාධාන: කිම්පක්ක නම් විෂ සහිත අඹ වැනි ගෙඩි වර්ගයකි. වර්ණයෙන් හා සුවඳින් අඹ වන් මේ ගෙඩි වැළඳීමත්, පස් කම් සැප රිසි සේ විඳීමත්, එක් වැනි කොට මෙහි දක්විය.

22 ඉස ගිනි ගත්තෙකු එගිනි නිවන ලෙස
කුසලට මඳකුත් පමා නොවෙනු මිස
මෙ සසර අත්හැර නොයන මෙ දුක් රුස
වෙසෙසින් නැත අත්හරිනා උප දෙස

අන්වය: ඉස ගිනි ගත්තෙකු එ ගිනි නිවන ලෙස මඳකුත් කුසලට පමා නො වෙනු මිස මෙ සසර අත්හැර නොයන මේ දුක් රුස අත්හරිනා වෙසෙසින් උපදෙස නැත.

පදාර්ථ: පමා නොවෙනු, ප්‍රමාද නොවෙනු විනා;

භාවාර්ථ: ඉස ගිනි ගත් මිනිසකු එගිනි නිවනා කාරයෙන් කුසල් කිරීමට මඳ කුත් පමා නොවීම මිසක් මේ සංසාරය අත්හැර නොයන මේ දුක් රුස අත් හරිනා වෙසෙස් උපදෙශයක් නැත්තේය.

23 තැත කින් ගෙන දැමුවත් කැට නුබ කුස
අ ත රක නොරඳන මෙන් මේ බිම මි ස
සි ත සතොසින් පින් නොකළොත් නිසි ලෙස
නැත සිටිනා තැන් සතර අපා මි ස

අන්වය: කැටගෙණ තැත කින් නුබ කුස දැමුවත් මේ බිම මිස අතරක නොරඳන මෙන් සිත සතොසින් නිසි ලෙස පින් නොකළොත් සතර අපා මිස සිටිනා තැනක් නැත.

පදාර්ථ: කැට, ගල් කැටයක්; තැතකින්, උත්සාහයකින්; නුබ කුස, අහසට; සතර අපා, සිවු අපායෙහි;

භාවාර්ථ: ගලක් ගෙණ උත්සාහයෙන් අහසට විසි කළහොත් එය මේ පොළවෙහි විනා උඩ අතර තුරෙක නොරඳන්නා සේ සතුටු සිතින් නිසි පරිදි පින් නොකළොත් සිවු අපාය යන්හි විනා වෙන සිටිනා තැනක් නැත.

ආක්ෂේප: සතර අපා කවරේද?

සමාධාන: නරකය - තිරිසන් ආත්මය - ප්‍රේතාත්මය - අසුර කාය යන මේ සතරයි.

24 ති රු වැ නො සිත කුණුකය මෙහ මායේ
නොතිර බවට විදුලිය උප මායේ
නි ත ර මෙකය පවකට නොන මායේ
ක ර ව කුසල් වීරිය නො ප මායේ

අන්වය: මෙතමාගේ කුණුකය තිරවැ නොසිත. නොතිර බවට විදුලිය උපමාගේ නිතර මෙ කය පවකට නොනමාගේ කුසල් නොපමාගේ විරිය කරව.

පදාර්ථ: තමා ගේ, තමා ගේ; කුණුකය, කුණපයෙන් පිරුණු ශරීරය; තිරවැ, ස්ථිර වූවක් කොට; උපමාගේ, උපමා ය. නො නමා, යොමු නොකොට; ගේ, යහපත් වූ;

භාවාර්ථ: මේ තමාගේ කුණුකය ස්ථිර යයි නො සිතව, එය අස්ථිර බවට විදුලිය උපමාවයි. නිතර මේ සිරුර පවක් සඳහා යොමු නොකොට යහපත්වූ කුසල් සඳහා පමා නොවී විරය කරව.

විග්‍රහ: තමා ගේ = තමාගේ "කාගේ අගුණ දුටුවත් කියන කිවිවරු" යන තන්හි දු ගේ, ගේ පස වෙනුවෙන් යෙදී ඇත. ගේ, යෙහෙ = ගේ, කුණු කය: කුණු සහිත කය; කයෙහි ඇති කුණප දෙතිසකි.

ආක්ෂෙප: ශරීරය තිර නැති බවට උපමාව කිමෙක් ද? ඒ ඇයි.?

සමාධාන: විදුලිය යි. සැනෙකින් ඇති වැ නැති වන හෙයිනි.

25 අඳු රෙහි අස් ලොම විදිනට දුර දී
විදු ලිය පැහැ වැරැදුන හොත් වර දී
විදු ලිය වන් මේ කය ලත් තැන දී
සිදු නො කළොත් මතු සගමොක් වර දී

අන්වය: අඳුරෙහි අස්ලොම දුරදී විදිනට විදුලිය පැහැ වැරදුන හොත් වරදී විදුලිය වන් මේ කය ලත් තැනදී සිදු නොකළොත් මතු සග මොක් වරදී.

පදාර්ථ: අඳුරෙහි, අන්ධකාරයෙහි; අස් ලොම, අශ්වයන්ගේ ලොමයක්; විදුලිය පැහැ, විදුලි ආලොකය; සිදු නොකළොත්; කුසල කම් සිඩ කර නොගත හොත්; මතු, අනාගත යෙහි,

භාවාර්ථ: අඳුරේ අස් ලොමක් දුර සිට විදිනු පිණිස විදුලිය එළිය වැරදුනොත් විදීම වරදී. විදුලිය වැනි මේ ශරීරය ලත් ස්ථානයෙහිදී පිත් සිදු කර නොගත හොත් මත්තෙහි ස්වර්ග මෝක්ෂ සැප වරදනේය.

ආක්ෂේප: අස් ලොම් විදීම නම් කිමෙක්ද? එය කෙසේ සාර්ථක කරනු ලබයිද? මෙහි ඒ උපමාව කුමකට දක්වීද?

සමාධාන: පෙර මෙරට ධනුශ්ශිල්පීහු "අස්ලොම් විදමන" යයි විදීමක් කළහ. ඉත් ඔවුන්ගේ විදීමෙහි දක්ෂ කම පළ වේ. අස් ලොම් විදීමට විදුලිය එළිය ඕනෑය. විදුලිය එළිය වැටෙනවාත් සමග ඉත් අස් ලොම බලා එල්ලය දැන විදීම සිරිති.

අස් ලොම් විදමනට විදුලිය එළිය ලැබුන වේලාවේ නොපමාව එල්ලය බලා විදින්නා සේ මේ මිනිසත් බව ලත් අවස්ථාවේ පිත් දහම් නොපමාව කළ යුතුයි. යනු මෙයින් අවබෝධ කරවයි.

26 කොතන වුනත් නැත මරුහට බාදු
විදින මෙ සැප පින් ඇති තෙක් වේදු
ගෙවන සසර දුක් බුදු බණ නාදු
කුමන නැටුම් කෙළි කවට සිනාදු

අන්වය: මරුහට කොතන වුනත් බාදු නැත විදින මෙසැප පිත් ඇතිතෙක් වේද? සසර දුක් ගෙවන බුදු බණ නාදු කුමන නැටුම් කෙළි කවට සිනාද?

පදාර්ථ: වේදු, වේද; නාදු, නො අදහා; සිනාදු, සිනාද;

භාවාර්ථ: මරුවාට කොතන උපන්නත් බාදවක් නැත. විඳින මේ සැපත පිත් ඇති තෙක් මැ වේද? සසර දුක් ගෙවන බුදු දහම නො අදහා කවර නැටුම් ද? කෙළිද? විහිළුද? සිනාද?

විග්‍රහ: නාදු = නො + අදහා = නො + අදු = න + අදු = නාදු

ආක්ෂේප: නො මැරෙණ තැනක් ඇත්තේද?

සමාධාන: නැත. නිවණ හැර අන් හැම තැන මරණය ඇත.

27 සැදූ හැත් තත් හට බවදුක් නො කැමැ ති
යහප ත් කල් මේ කල් මිස වෙන නැ ති
දනිතොත් දන් සිල් ගුණ සත නොනැවැති
පැය කුත් අවුරුදු දහසක් විත ර ති

අන්වය: බව දුක් නො කැමැති සැදැහැත්තත් හට යහපත් කල් මේ කල් මිස වෙන නැති. සත දන් සිල් ගුණ දනිතොත් නො නැවති. පැයකුත් අවුරුදු දහසක් විතර ඇති.

පදහස්: බව දුක්, සසර දුක්; නො කැමති, කැමැති නොවූ; සැදැහැත්තත් හට, ශ්‍රද්ධාව ඇතියන් හට; ..... සත, සත්ත්වයා; නොනැවති, පින් කිරීමෙහි නැවතීමක් නොවේ.

භාවාර්ථ: සසර දුක් නො කැමති සැදැහැතියනට මේ කාලය මිස වෙනත් හොඳ කාලයක් නැත. දන් සිල් ගුණ දන්නා සත්ත්වයා එය කිරීමෙහි නැවතීමක් නොවේ. හැම තන්හි හැම මොහොතේ ම කරයි. එනිසා පින් කරන අයට පැයක් අවුරුදු දහසක් ප්‍රමාණ වෙයි.

28 අද අද එයි මරු පින් කර ග න්නේ
කුම ටද සෙට මරු නේති සිත න්නේ
කිකලද මහසෙන් මරු ඇප ව න්නේ
කුම ටද කුසලට කම් මැලි ව න්නේ

අන්වය: මරු අද අද එයි. පින් කර ගන්නේ. සෙට මරු නේති සිතන්නේ කුමටද? මහසෙන් මරු ඇප වන්නේ කිකලද? කුසලට කම්මැලි වන්නේ කුමටද?

පදහස්: මරු, මරණය; නේති, නො එතියි; මහසෙන් මරු, මහා සේනා ඇති මාරයාට;

භාවාර්ථ: මරණය අද අද එයි. මෙසේ සිතා පින් කර ගන්න. හෙට මාරයා නො එන්නේ යයි කෙසේ සිතමුද? මහා සේනා සහිත මරුවාට ඇප වෙන්නේ කවර කලකද? එ නිසා කුසලට කම්මැලි වන්නේ කුමටද? හැම මොහොතෙහි ම පින් කරන්න.

විග්‍රහ: නේති, න + එති - නේති;

29 කු ම ට ද කා බී නිති සැර සෙන් නේ
කොතැනද මේ කය ඇර ගෙන යන් නේ
හැ ම ස ඳ නොමැලිව පින් කර ගන් නේ
එ ම ව ද බව සයුරෙන් ගොඩ ලන් නේ

අන්වය: කා බී නිති සැරසෙන්නේ කුමට ද? මේ කය ඇරගෙන යන්නේ කොතැන ද? හැම සඳ නො මැලිව පින් කරගන්නේ. එමවද බව සයුරෙන් ගොඩ ලන්නේ.

පදාර්ථ: සුගමයි.

භාවාර්ථ: කකා බිබී නිතර සැරසෙනු කුමට ද? මේ සිරුර කොතැනක අරගෙන යන්ට ද? මෙහි ම නැතිවී යයි. එනිසා හැමදම අලස කම් දුරලා පින් කරන්න. එය ම බව සයුරින් ගොඩ ලැමට හේතු වේ.

30 තෙරවැ සසර සයුරින් තෙපි නොල සා
නි ර ව ලබන මොක් සිරි සැප සක සා
තොරව පවින් නිතරම මුනි බණා සා
ක ර ව කුසල් විරිය පසු නො බැ සා

අන්වය: තෙපි නොලසා සසර සයුරෙන් තෙරවැ සකසා නිරව මොක් සිරි සැප ලබන මුනි බණ අසා නිතර ම පවින් තොරව පසු නො බැසා කුසල් විරිය කරව.

පදාර්ථ: සුගමයි.

භාවාර්ථ: යුෂ්මත්හු අලස නොවී සසර සයුරෙන් එතෙර වැ සකස් වැ ස්ථිරවැ නිවන් සැප ලබන බුදු බණ අසා නිතරම පවින් වෙන්ව පසු නො බැස පින් දහම් කිරීමට විරිය කරව්.

31 හැ ම වි ට පිනටම සිත පා දන්නේ
නි ව ණ ට මග එම වද සා දන්නේ
වැ ඩ ක ට කී බස් කිම නා දන්නේ
නි ර ය ට වන් කල දෝ නොප දන්නේ

අන්වය: හැම විට පිනටම සිත පාදන්නේ. නිවනට එම වද මග සාදන්නේ. වැඩකට කී බස් නාදන්නේ කිම? නිරයට වත් කලයේදී තොප දන්නේ?

පදාර්ථ: පාදන්නේ, පහදන්නේය. එමවද, ඒ සිත් පැහැදීම මැ; වැඩකට, වැඩි දියුණුව සඳහා; නා දන්නේ, නො අද-හන්නේ= විශ්වාස නොකරන්නේ; දන්නේ, දැන ගන්නේ;

භාවාර්ථ: හැමදම සිත පින් දහම් උදෙසා පහදා ගන්න. එයම නිවණට මග සාදයි. වැඩකට කී වචන නො අදහන්නේ ඇයිද? තොප මේ බව දැනගන්නේ අපායට ගියවිට ද?

32 මොක් සිරි දෙන මුනිඳුන් ගේ උපත කි
ක ප් කෙළ සිය දහ සකිනුත් නො ලද කි
ප ත් වූ එ බුදුන් ගෙන් යුත් මෙකල කි
එ ත් වැරදුන නැත පරලොව පිහිට කි

අන්වය: මොක් සිරි දෙන මුනිඳුන්ගේ උපතක් කප් කෙළ සිය දහසකිනුත් නො ලදකි. පත් වූ එ බුදුන්ගෙන් යුත් මෙ කලකි. එත් වැරදුන පරලොව පිහිටක් නැත.

පදාර්ථ: උපතකි, උත්පත්තියක්; කප් කෙළ සිය දහසකි-නුත්, කල්ප කෝටි සියක් දහසකිනුත්; නො ලද ඇකි, නොම ලැබිය හැකිය. මේ කලකි, මේ කාලයක් ය. එත්, එයත්; වැරදුන, වැරදුන හොත්; පරලොව, මරණින් මතු; පිහිටකි, උපකාරයක් = ප්‍රතිෂ්ඨාවක්; නැත, නැත්තේ ය.

භාවාර්ථ: නිවන් සැප දෙන බුදුරදුන් ගේ උපතක් කල්ප කෝටි සිය දහසකින් වත් නො ලැබේ. ඒ බුදු පියාණ කෙනෙ-කුන් උපන් මේ කාලය හොඳ කාලයකි. මේ අවස්ථාවත් වැරදුන හොත් පරලොව කිසි ම පිහිටක් නො ලැබේ.

විග්‍රහ: නො ලද + ඇකි = නො ලදකි.

කල්ප: ඉතා දික් කාලයකි. අනන්ත කල්ප, අසංඛ්‍ය කල්ප-මහා කල්ප යයි කල්පය ත්‍රිවිධය. එය ද ශූන්‍ය-අශූන්‍ය වශයෙන් දෙකට බෙදේ.

ශූන්‍ය කල්පයෙහි බුදු – පසේ බුදු – රහත් යනාදිහු නූපදිති. අශූන්‍යයෙහි උපදිති. අශූන්‍ය කල්පය ද පංච විධය. ඒ මෙසේ ය. සාර – මණ්ඩ – වර – සාරමණ්ඩ – භද්‍ර යනුයි. මේ භද්‍ර කල්ප යයි. බුදුන් පස් නමක් මේ කල්පයෙහි උපදනාහුය. ඉන් කකුසඳ– කොණාගමන– කාශ්‍යප– ගෞතම යන සතර නම උපන් හ. මෛත්‍රෙය බුදුහු අනාගතයෙහි උපදිති.

33 අ ත් වැඩ පරවැඩ සමව සිතන් නෝ
මෙත් සිත සව් සත කෙරෙහි කරන් නෝ
එ ත් බැරි නම් තොප සසර ගෙවන් නෝ
සෙත් පුර සැප කෙලෙසකද ලබන් නෝ

අන්වය: පැහැදිලියි.

පදාර්ථ: අත්වැඩ, තමාගේ කටයුතු; පරවැඩ, අනුන්ගේ කටයුතු; සමව සිතන්නෝ, සමානව සිතන්න; මෙත් සිත, මෛත්‍රී සිත; සව් සත කෙරෙහි, සියලු දෙනා කෙරෙහි; කරන්නෝ, කරන්න; එත්, එයත්; බැරිනම්, බැරි වේ නම්; තොප, යුෂ්මතුන්; සසර, සංසාරය; ගෙවන්නෝ, ගෙවන්නේත්; සෙත්පුර, නිවන්පුර; සැප, සම්පත්තිය; ලබන්නෝ, ලබන්නේත්; කෙලෙසක ද? කවර අයුරින් ද?

භාවාර්ථ: ආත්මාර්ථයත් පරාර්ථයත් දෙක සම ව සිතන්න. මෛත්‍රිය හැම දෙනාටම වඩන්න. එයත් බැරිනම් තොප බවයෙන් එතෙර වන්නේත් නිවන් සැප ලබන්නේත් කවර ලෙසකින් ද?

විග්‍රහ: අත්වැඩ = තමාගේ යහපත පිළිබඳ වැඩ.
පරවැඩ = අනුන්ගේ යහපත සඳහා කෙරෙන වැඩ.

34 ම ස් ලේ නැති ඇට බලු ලෙව කන්නේ
කු ස් පිරුමක් පලයක් නොල බන්නේ
ලෙස් ඒ සැපතෙහි සැප නො සි තන්නේ
දෙස් නො පෙනෙනු මිස දුක්මයි වන්නේ

අන්වය: මස් ලේ නැති ඇට බලු ලෙවකන්නේ. කුස් පිරුමක් පලයක් නො ලබන්නේ ඒ ලෙස සැපතෙහි සැප නො සිතන්නේ. දෙස් නොපෙණෙනු මිස වන්නේ දුක්මයි.

පදාර්ථ: කුස්, බඩ; පිරුමක්, පුරීමක්; පලයක්, ප්‍රයෝජනයක්; ඒ ලෙස්, ඒ අඳුමින්; සැපතෙහි, පස් කම් සැපතෙහි; සැප, සැපයයි;

භාවාර්ථ: මස් හං ලේ රහිත ඇට බල්ලා ලෙවකන්නේ ය. ඉන් උගේ බඩ නොපිරේ. එහෙයින් ප්‍රයෝජනයක් නො ලැබේ. නමුත් රසාස්වාදය පමණක් ලැබේ. එසේම පස් කම් සැපත සැපතක් යයි නො සිතන්න. දේශය නො පෙණෙතු විනා සිදු වන්නේ දුක් මැයි.

35 මස් කැටියක් ගත් උකුසෙකු අහ සේ
මස් නො දමුව උකුසන් ගෙන් වැනැ සේ
පස් කම් රස ලොබ කළහොත් එම සේ
පස් විසි මහ බයකින් දුක් සැල සේ

අන්වය: මස් කැටියක් ගත් උකුසෙකු අහසේ මස් නොදමුව උකුසන්ගෙන් වැන සේ. එම සේ පස් කම් රස ලොබ කළ හොත් පස් විසි මහ බියකින් වැන සේ.

පදාර්ථ: නො දමුව, නො දමුවහොත්; පස් විසි මහ බියකින්, මහ බිය විසි පහකින්;

භාවාර්ථ: මස් කැටියක් ඩැහැගෙන අහසෙහි පියාඹන උකුස්සා ඒ මස් පිඩ බිම නො හෙළු යේ නම් අනික් උකුසන් ගෙන් විනාශයට පැමිණේ. එසේම පංචකාම සැපයෙහි ලොභයෙන් ගැලී සිටින මිනිසා බිය විසි පහකින් විනාශ වේ.

ආක්ෂේප: පස් විසි බිය කවරේ ද?

සමාධාන: ජාති - ජරා - ව්‍යාධි - මරණ - සෝක. යන මේ බිය පස අතීත - වර්තමාන - අනාගත යන කාල තුනටම එළඹේ. එනිසා මහ බිය පසළොසකි. තවත් බිය දශයක් වේ. ඒ මෙසේ ය. රාජ - සොර - සතුරු - ජල - ගිනි - දණ්ඩ - දුගති - රෝග අත්තානුවාද = තමා සිතින් තමාටම අපවාද නැඟීම; පරානුවාද = අනුන්ගෙන් අපවාද ලැබීම යන මේ බිය දශයයි. ඉහතින් දක් වූ පසළොස හා මේ දශය ද එක්ව මහ පස්විසි බිය පිරේ.

36 සෙත සලසන මුනි බණ ඇත සුමි හි රි
ඇ ත තොපගේ කන් ඇසුමට නොබි හි රි
නැ ත කරනට පිනකුත් මෙ තොපට බැ රි
ස ත ර අපා දුක් වද විඳිනට බැ රි

අන්වය: මුනි සුමිහිරි සෙත සලසන බණ ඇත. ඇසුමට තොපගේ නො බිහිරි කන් ඇත. මෙතොපට කරනට බැරි පිනකුත් නැත. සතර අපා දුක් වද විඳිනට බැරි.

පදාර්ථ: මුනි, බුදුන්ගේ;

භාවාර්ථ: බුදුන් දෙසූ සුමිහිරි වූ සෙත් සලසන ධර්මය පවතී. ඒ ඇසීමට බිහිරි නොවූ කන් තොපට ඇත. කිරීමට බැරි පිනකුත් නැත. එසේ කළහොත් සතර අපා දුක් වේදනාව විඳීමට නො හැකි වේ.

37 කරන කලට පව් මිරිය මී සේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිනි සේ
ඇඳින එපව් දුරලන උප දේ සේ
නුදුන මැනැවි තුන්දොර අව කා සේ

අන්වය: පව් කරණ කලට මී සේ මිරිය, විඳින කලට ගිනි සේ දැඩිවෙයි. එ පව් දුරලන උපදේ සේ ඇඳින තුන් දොර අව කා සේ නුදුන මැනැවි.

පදාර්ථ: මී සේ, මීපැණි ලෙසින්; මිරිය, මිහිරි වෙයි; අවකාසේ, ඉඩ; තුන්දොර, සිත, කය, වචනය යන ද්වාර තුණ;

භාවාර්ථ: පාපයන් කරණ කලට මී පැණි මෙන් මිහිරිය, ඉන් සිදුවන දුක් විඳින කල ගිනි සේ දැඩිවෙයි. ඒ පව් දුරු කරණ උපදෙශය දැන ගෙණ සිත කය බස යන තිදොර ඉඩ නො දීම යහපති.

38 අ ද මි න් ජීවත් වෙනුවා විතර ට
දැ හැ මි න් මිය යනු සොඳමයි දනහ ට
මෙලෙසින් වදහළ මුනි බණ සිහිකො ට
සැ බැ වි න් පින් කොට පැමිණෙව් නිවණ ට

අන්වය: අදමින් ජීවත් වෙනවා විතරට දැහැමින් මිය යනු දනායට සොඳමියි. මෙලෙසින් මුනි වදහළ බණ සිහිකොට සැබවින් පින්කොට නිවණට පැමිණෙව්.

පදර්ථ: අධර්මයෙන් ජීවත් වෙනවාට වඩා ධර්මයෙන් මියයෑම හොඳමයි. මේ අයුරින් බුදුන් දෙසූ බණ සිහිපත් කර සැබැවින් මැ පින් කර නිවන් දකිව්.

39 එ ක ම සතකු තම මව් මළ දුක ටා
වෙනම හැඬූ කඳුලේ බිඳුවල ටා
මෙහැම මුහුදු දිය අඩුවන කල ටා
ත ව ම සසර ආලය ඇයි තොප ටා

අන්වය: එකම සතකු තම මව් මළ දුකට වෙනම හැඬූ කඳුලේ බිඳු වලට මෙහැම මුහුදු දිය අඩුවන කලට තවම තොපට සසර ආලය ඇයි?

පදණී: සුගමයි.

භාවාර්ථ: එක් සත්ත්වයෙකු සිය මෑණියන් මළ දුක නිසා වෙන වෙනම හැඬූ කඳුළු බිඳු එක්වුවහොත් මේ මහ මුහුදු සියල්ලෙහි ජලය ස්වල්පය. කඳුළු අධිකය. එසේ තිබියදී තවම තොපට සංසාර තෘෂ්ණාව මක්නිසා ද? එකම සත්ත්වයා මේ භවයෙහි අපමණ වාර ගණනක් ඉපද මැරී තිබෙන බව මෙයින් වැටහේ.

විග්‍රහ: මාතෘවාචී මව්, සදක් මිස "මවු" සදක් හෙළ යෙහි නො ලැබේ. වුකාරය අන්ත කොට ඇති පවු - සවු. ආදිය පව්ව, සව්වා, ඈ විසින්ද මව්, පව්, ආදිය මව - පව ඈ විසින් ද වරනැගේ.

40 ලි ප ගිනි මොලවන නෙක් දිය සැ ළියේ
සැප යක් යයි සකුළුව දිය කෙ ළියේ
ඒ ප ව ත් තොප සිතතොත් නො හැකි ළියේ
සැප යක් නම් නැත කම්රස කෙ ළියේ

අන්වය: ලිප ගිනි මොලවන තෙක් දිය සැළියේ සැපයක් යයි කකුළුව දිය කෙළියේ. එපවත් නොහැකිළියේ තොප සිත තොත් කම්රස කෙළියේ සැපයක් නම් නැත.

පදාර්ථ: නොහැකිළියේ, හැකිළීම් රහිත වැ; කම්රස කෙළියේ, පස්කම් රස ක්‍රීඩාවෙහි;

භාවාර්ථ: ලිපේ ගිනි මොලවන තුරු එහි මත රඳන සැළි-යෙහි ලූ ජලයෙහි පිහිනා නටන කකුළුවා සැපයක් යයි සොම්නසට පත් වේ. දිය රත් වන විටය උෂ්ණට එහි රඟ දැනෙන්නේ. කම් රස විඳිමින් කෙරෙන සෙල්ලම් ද අර කකුළුවාගේ නැටීම් මෙනි. මේ බව හිතන විට පවා කම්රස කෙළිය විරස වේ.

විග්‍රහ: මොලවන තෙක්; මොලවා අවසාන වනතුරු. තෙක්, යන නිපාතය අවසාන සීමාව දක්වයි.

41 උ ඩු සුළඟට අල්වා ගෙන ය න්නේ
තණ සුල නොදනී නම් අතද න්නේ
ව ර පල යයි කම්රස තෙප ල න්නේ
එ ද කළ කම් නිරයේ පැස ව න්නේ

අන්වය: උඩු සුළඟට තණ සුල අල්වාගෙන යන්නේ නොදනී නම් අත දන්නේ. කම්රස වරපල යයි තෙප ලන්නේ. එද කළ කම් නිරයේ පැස වන්නේ.

පදාර්ථ: උඩු සුළඟට, උඩුකුරුව හමනා සුළඟට; තණ සුළ තණ වලින් බැඳගත් ගිනිහුල;......... යන්නේ, යන තැනැත්තේ නො දනී නම්, නොදන ගියේ නම් අත, අත; දන්නේ, දැවෙන්-නේය. කම්රස, කාම සැපය; වර පල යයි, උතුම් පල ඇත්තේයයි; තෙපලන්නේ, කියන්නේ නමුත්; එද, එයින්ද; කළ කම්; කරණ ලද කර්මය; නිරයේ, නරකයෙහි; පැසෙන්නේ, පැසවන්නේය.

භාවාර්ථ: තණ හුල දල්වා උඩු කුරුව ගෙන යන මිනිසා නො දැනුවත් වමැ ඔහුගේ අත පිළිස්සේ. කම් රසය නොදන විඳිනම් ඔහුටද වනුයේ මෙලොවදී කළ කම් අනුව නිරයේ පැසීමටය.

42 පිරුළෙන් අරගත් අබරණ මගුල ට
දමමින් ගැති වන අයමෙන් අනුන ට
පෙර පින් ඇතිතෙක් විඳිනා සැපත ට
තෙපි දූන් උඩඟුව නොවදිව් නිරය ට

අන්වය: මඟුලට පිරුළෙන් අරගත් අබරණ දමමින් අනුනට ගැතිවන අයමෙන් පෙර පින් ඇති තෙක් විඳිනා සැපතට දූන් තෙපි උඩඟුව නිරයට නොවදිව්.

පදාර්ථ: මඟුලට, මංගල්‍යය සඳහා; පිරුළෙන්, අංපසු දීමට (පිරුවට වශයෙන්) අනුනට; අනුන්හට; ගැතිවන, සටහන්වන;

භාවාර්ථ: මඟුල සඳහා අංපසු දීමේ පොරොන්දුව පිට ගත් ආබරණ නැතිකර දමා අනුන්ට යටත් වන මිනිසුන් මෙන් තෙපි පෙර පින් තිබෙනා තුරු විඳිනා සැපත නිසා උඩඟුවී මරණින් පසු නිරයට නොයව්.

විග්‍රහ: පිරුළෙන් = පිරුළු × එන්; අංපසු දීම සඳහා ටිකකට ඉල්වා ගන්නේ පිරුළු නම්. පිරුවට යනු වර්තමාන ව්‍යවහාර යයි. පෙර පිනකින් ලත් මේ සැපත පිරුළක් වැන්න. ටික කලකට සීමා වන හෙයිනි. එයට උඩඟුවීම නිරයට යැමට හේතුවේ.

43 වද යට බැඳගෙන ගෙන යන සොරු ටා
වද මල් දම් ලූ බෙර පිරි වර ටා
ලද ඉසුරෙහි ලොබ වූවොත් පින ටා
එද සැපතෙහි කළ කම් මරු රව ටා

අන්වය: වදයට බැඳගෙන ගෙන යන සොරුට වද මල් දම් බෙර පිරිවරට ලූ (මෙන්) පිනට ලද ඉසුරෙහි ලොබ වූවොත් එද සැපතෙහි කළ කම් මරු රවටා

පදාර්ථ: වධයට, වධය පිණිස; .... පිනට, පින් කිරීම සඳහා; ඉසුරෙහි, ඓශ්වර්‍ය්‍යයෙහි; එද, එයද; කම්, ලෝභ කර්‍මය;

භාවාර්ථ: වධය සඳහා බැඳගෙන යන සොරාහට වදමල් දම් හා බෙර පිරිවර සඳහා ලූවාක් මෙන්ම පින් කිරීම සඳහා ලැබුන එම සම්පත්තියෙහි ලොභ වුවහොත් මරුවා ඒ ලෝබ කම් කරන්නා රවට යි. මේ ලද සැපත මරණයට බැඳගෙන යන සොරාට ලැබී තිබෙන වද මල් මාලාව– බෙර ආදිය මෙනි. සත්ත්වයා ඒ සැපතට ලෝබ කළහොත් මාරයා විසින් ඔහු රවටනු ලබයි.

විග්‍රහ: වද මල් දම්, – වද ද එම මල්ද = වද මල් වද මලින් කළ දම් = වද මල් දම්, = වද මල් මාලා.

44 දුමු වෙන් ගිරි මුදුනෙන් හෙන සොරු ටා
පවතින් කම් නැති මෙන් ඇඟ ගිම ටා
ජරයෙන් මිදෙමින් යන මරු මුව ටා
සැපතින් කිම පල පව් කළ තොප ටා

අන්වය: ගිරි මුදුනෙන්, දුමුවෙන් හෙන සොරුටා ඇඟ ගිමට පවතින් කම් නැති මෙන් ජරයෙන් මිදෙමින් මරුමුවට යන පව් කළ තොපට සැපතින් පල කිම?

පදාර්ථ: ගිරි මුදුනෙන්, පර්වත මස්තකයෙන්; දුමුවෙන්, හෙළන ලද හෙයින්; හෙන, වැටෙන; ඇඟ ගිමට, ශරීර ග්‍රීෂ්මයට; පවතින්, සුළඟින්; කම්නැති මෙන්, වැඩක් නැතිවාක් මෙන්; ජරයෙන්, ජරාවෙන්; මරුමුවට, මාර මුඛයට;

භාවාර්ථ: පර්වත මුදුනකින් හෙළන ලදුව පහළට ඇද වැටෙන සොරා ගේ ශරීර ග්‍රීෂ්මයට සුළං කුමකට ද? ජරාවෙන් මිදී මාර මුඛයට යන මිනිසාට සැපතින් කවර පලක් ද?

45 අල වන මේ කම් රස දෙස විම සා
පල යව් තපසට පුළුවන් වය සා
පල රස විඳ ගස උඩ උන් මිනි සා
මුල සිදෙනා තෙක් ඉදිද්දෝ නොබැ සා

අන්වය: සුබොධයි.

පදාර්ථ: අලවන = ආල වන

භාවාර්ථ: සිත් අලවන මේ පස් කම් රසයෙහි දෙස් පිළිසඳ දැන ප්‍රාඥයන් ව්‍යසන හිදී තපසට පලයව්. ගෙඩි කකා රස විඳ ගසක සිටින මිනිසෙක් ඒ ගසේ මුල කපා හෙලන තුරු නො බැස බලා හිඳී ද? නො හිඳී.

46 බණ නම් නිබොරුය මුනිවරය න්නේ
කය නම් නො තිරය අදහා ග න්නේ
පණ නම් තණ අග පිනි බිඳු වැ න්නේ
පින නම් නො පමාවම කර ග න්නේ

අන්වය: මුනිවරයන්නේ බණ නම් නිබොරුය. කයනම් නො තිරය අදහා ගන්නේ. පණ නම් තණ අග පිනි බිඳු වැන්නේ. පින නම් නො පමාවම කර ගන්නේ.

පදාර්ථ: නො තිරය = අස්ථිරය. අදහා ගන්නේ = විශ්වාස කරන්න.

භාවාර්ථ: මුනිවරයන් ගේ ධර්මය බොරු නො වේ. ශරීරය අස්ථිරයයි විශ්වාස කර ගන්න. පණ තණකොළ අග ලෙල දෙන පිනි බින්දුවක් සේ අනිත්‍යය. එ නිසා පමාද නො වී පින් කර ගන්න.

47 අසන් මෙ මා කී දේ වැඩ ඇති ව න
පසන් සිතින් උන්නත් පව් කර මි න
උපන් නොතින් මතු යක් බූ පිසසු න
සයින් ඇවිද පිනකුත් බැරි එ පව් න

අන්වය: මෙ මා කී වැඩ ඇතිවන දේ අසන් පව් කරමින පසන් සිතින් උන්නත් මතු යක් බූ පිසසුන උපන් නොතින් එපවින සයින් ඇවිද පිනකුත් බැරි.

භාවාර්ථ: මේ මා කියූ වැඩ ඇති දේ අසනු. පව් කරමින් පහන් සිතින් උන් නමුත් ඒ පවින් මතු යක්‍ෂ භූත පිසාච ආත්ම යෙක උපන්න හොත් බඩගින්නෙන් ඇවිද පිනක් කිරීමට බැරි වේ.

48 ලොබේ සිතින් පව් කළ සැම සත ටා
ස බේ කියති ගෙන ගොස් යම රජු ටා
ඉ බේ ඉන්ට නො යෙදී සිතූ රග ටා
ලැ බේ නිරා දුක් පැමිණි එවි ටා

අන්වය: ලොබේ සිතින් පව් කළ හැම සත ගෙන ගොස් සබේ යම රජුට කියති. එවිට සිතූ රඟට ඉබේ ඉන්ට නො යෙදී පැමිණි නිරාදුක් ලැබේ.

පදාර්ථ: සුබෝධයි.

භාවාර්ථ: (යම දූතයෝ) ලෝබ සිතින් පව්කළ හැම සත්ත්වයන් ගෙන ගොස් සභාව ඉදිරිපිට යම රජුට කියති. එවිට හිතේ හැටියට තනි වැ ජීවත් වීමට නො ලැබ පැමිණි නිරාදුක් ලැබෙන්නේ ය. යමරජු = මරණින් පසු සත්ත්වයන් කළ වරද නිවරද විනිශ්චය කරතැයි සලකන අපායේ රජු යි.

49 තොසින් නොයෙක් සැපවිඳ සමහරැ නිති
ඇ සි න් ම දැක පින් පව් කළ වුන් ගති
බ සි න් කිවත් අදහා පින් නොකර ති
ගොසින් නිරේ වැටුනොත් දුක් හිම් නැති

අන්වය: සමහරැ නිති තොසින් නොයෙක් සැප විඳ පව් පින් කළවුන් ගති ඇසින් මැ දැක බසින් කිවත් පින් නො කරති. ගොසින් නිරේ වැටුනොත් දුක් හිම් නැති.

පදාර්ථ: සුබෝධයි.

භාවාර්ථ: නිතර සන්තොසින් නොයෙක් සැප විඳින සමහරැ පව් පින් කළ අයගේ ආකාරය ඇසින්ම බලා වචනයෙන් ප්‍රකාශ කළත් පින් නොකරති. ඔවුන් මරණින් මතු ගොසින් අපායේ වැටුනොත් ලැබෙන දුක නම් හිම් නොවේ.

50 පි න් පව් නොදැනම අනුවණ කම් කො ට
ක න් නන් මස් රස හොඳමයි කර තු ට
ඉ න් ගැල වෙනු බැරි නොගොසින් නිරය ට
දැ න් එම ආලය හරිනේ අද සි ට

අන්වය: පින් පව් නො දනම් අනුවණ කම් කොට මස්රස යොදම්යයි තුට කර කන් නන් නිරයට නො ගොසින් ඉන් ගැලවෙනු බැරි. දුන් අද සිට එම් අංලය හරිනේ.

පදර්ථ: අනුවණකම් = මෝඩකම්.

භාවාර්ථ: මේ පින පව යයි නො දන මෝඩකම් කර (සතුන් මරා) මස් රසය ඉතා හොඳ යයි සතුටු කර වළඳන්නවුන් නිරයට නො ගොසින් ඒ පාපයෙන් කෙ සේ මිදෙන්ටද? දුන් අද පටන් මස් රසයට තිබෙන දැඩි අංසාව හරින්න.

51 කාලා රස මුසු බෝජන කර පෙම්
ගාලා සුවඳැති සඳුනුත් මන රම්
ලාලා අබරණ නිසි ලෙස සැර සුම්
පාලා ගිය වැනි බහුරූ කෝ ලම්

අන්වය: පෙම් කර රස මුසු බෝජන කාලා මනරම් සුවඳැති සඳුනුත් ගාලා අබරණ ලාලා නිසි ලෙස සැරසුම් (කොට) බහුරූ කෝලම් පාලා ගිය වැනි.

පදර්ථ: ලාලා, ලාගෙන; බහුරූ කෝලම්, බොහෝ රූප හෙවත් වෙස් ගතිමින් කෙරෙන කෝලම් (විහිළු) පාලා, පෙන්වා;

භාවාර්ථ: නළු නිළියන් ආලය කර රස මිශ්‍ර භොජන වළඳා සිත් පිනවන මිහිරි සුවඳ ඇති සඳුන් ගාමින් අබරණ පළඳිමින් නිසි ලෙස සැරසී නානා වෙස් ගෙන කෝලම් පාලා ගියාක් මෙන් මිනිස්සු ද නා නා ලෙසින් සැරසී නා නා වෙස් ගතිමින් සිට හුදෙකලාව මිය යති යි කියයි.

52 මෙ බස් තම නුවණින්ම විමසා,
නොතිර වූ කය ගති අසා න්නේ
දෙ තිස් කුණුයෙන් යුතුවූ මඳකුත්
සාරනු බව නැණින් ද න්නේ
මි නි ස් බව ලත් තැනේ කුසලක්
නොකර උන්නොත් අපල වන්නේ
ස ති ස් එක් සිය නිරේ වැටුනොත්
එදයි අනුවණ කම් දැනෙ න්නේ

අන්වය: පහසුයි.

පදාර්ථ: මෙ බස්, මේ වචන; ගති, සවභාවය; දෙතිස් කුණුයෙන් කුණප තිස් දෙකකින්; සාර නූ, හරයක් නැති; සතිස් එක් සිය නිරේ. එකසිය තිස් හයක් නරකාදිවල;

භාවාර්ථ: මේ කියූ දහම් සිය නැණින් ම විමසා අස්ථිර වූ ශරීර සවභාවය අසන්න. කුණප කොටස් තිස් දෙකකින් යුත් වූ මෙහි මඳ හරයක් වත් නැති බව නුවණින් දැන ගන්න. මිනිස් ආත්මය ලත් තැනේදී පිනක් නො කර උන්නොත් අවැඩ සිදු වේ. 136 ක් නරකාදි වල වැටුනදාට මෝඩකමේ රඟ දැනේ.

විග්‍රහ: දෙතිස් කුණු: කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩු, හදවත, අක්මාව, දලබු, බඩදිව, පපුමස, බඩවැල, කුඩා බඩවැල්, ආමාසය, අශුචි, පිත, සෙම, සැරව, ලෙය, ඩහදිය, මේදස්, කඳුළු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳ මිදුළු, මුත්‍ර, හිස් මොළ යන මේ දෙතිසයි.

එක්සිය සතිස් නිරය:

සංජීවය — මහාරෞරවය
කාල සූත්‍රය — තාපය
සංඝාතය — ප්‍රතාපය
රෞරවය — අවීචිය යන අටත් ඒ වටා පිහිටි 128 ක් ඔසුපත් නරකත් යන සියල්ල එක්වූ විට 136 ක් නිරය නම්.

53 පෙරත් ජාතියෙ පතා ගත් දැන්
සේතු බලයෙන් මෙතැන් නේ
ළඟත් වෙන් නොව සමග දවසැර
උන් නමුත් සෙනෙ හසින් නේ
පණත් යන කල තනිව ගෙයි උන්
අයත් වෙන්වේ බඳින් නේ
පිනුත් කළ නිති කැටුව යෙයි ගිය
තැනේදී සැප විඳින් නේ

අන්වය: සුගමයි.

පදාර්ථ: සේතු බලයෙන්, හේතු බලයෙන්; වාසනා බලයෙන්.

භාවාර්ථ: පෙර ජාතියෙහි ප්‍රාර්ථනා කළ වාසනා බලයෙන් මේ ආත්මයෙහි වෙන්නොවී දවස් ගත කරමින් සිටි නමුදු පණ යන වේලාවට ඒ ස්ථානයෙහි හෙවත් ගෙහි සිටි අය පවා ඥාති බන්ධනයෙන් වෙන්වනු සිටිති. එහෙත් ඔහු කළ කුසලය කැටුව යෙයි. ගිය තැන සැප විඳීමට එය හේතුවේ.

මැරෙණ වේලාවෙහි එක් ව කල් යැවූ නෑ මිතුරන් ගෙන් වෙන් වන බවත් තමා කළ පින් වෙන් නොවී සමග පැමිණ සැපයට හේතු වන බවත් කියයි.

54 සා ර නූ කුණු කයක් අරගෙණ
කරණ බහුනාටක තදේ
නෑ ර තම හිමි සමග දව සැර
උන් නමුත් සැප විඳ විදේ
ගෝර මරුවා පැමිණි කල් දැනැ
යන්ට කැඳවා එන සදේ
බා ර වම සිටුවන්ට බැරිවද
පිනක් කර ගත් තොත් සොදේ

අන්වය: සාරනූ කුණු කයක් ඇරගෙන කරණ බහුනාටක තදේ තම හිමි නෑර සමග සැප විඳ විඳ දවසැර උන් නමුත් පැමිණි කල් දැන ගෝර මරුවා යන්ට කැඳවා එන සදේ බාරවම බැරිවද පිනක් කරගත්තොත් සොඳේ.

පදාර්ථ: සාර නූ, සාර නොවූ; බහුනාටක, බොහෝ නැටුම්; තදේ, දැඩි වශයෙන්; දව සැර, දවස් යවා; ගෝර වූ (=බිහිසුණු වූ) යන්ට, පරලොව යන්ට; කැඳවා, අමතා; එන සදේ, එන කල්හි; බාරවම, බාරයක් වී නමුදු; බැරිවද, නවතින්ට බැරිවේ ද;

භාවාර්ථ: නිස්සාර කුණු කයක් ඇරගෙණ කරණ නාටක බොහෝය. තම හිමි අත නොහැර එක්ව සැප විඳ විඳ දවස් යවා සිටියත් ඝෝර මාරයා නියම වේලාවට ආ කල බාරයක් වී වත් නවතා ගන්ට බැරිය. එනිසා පිනක් කරගත්තොත් හොඳය.

විග්‍රහ: දවස් + ඇර = දවසැර. නො + වූ (නො + උ්‍ය) = නූ

55 සරණ මුනිඳුගෙ අදහ පිනකුත්
නොකර ඉන්නේ කුමට දෝ
මරණ පැමිණෙන කලට යමයා
ඇවිත් කැඳවා යන්ට දෝ
කරණ සොඳකම් දන් පිනක් කළ
කියනු නුවණින් සොඳ වෙ දෝ
කුමන අනුවණ කම්ද නෑසිනි
අඬනු සිටුවා ගන්ට දෝ

අන්වය: මුනිඳුගෙ සරණ අදහා පිනකුත් නොකර ඉන්නේ කුමටදෝ මරණ පැමිණෙන කලට යමයා ඇවිත් කැඳවා යන්ට දෝ, නුවණින් කරණ සොඳකම් දන් පිනක් කළොත් සොඳ වෙදෝ; කියනු. නෑසිනි අඬනු කුමන අනුවණ කම්ද? සිටුවා ගන්ටදෝ?

පදාර්ථ: මුනිඳුගෙ, බුදුපියාණන්ගේ; සරණ, පිහිට; අදහා, විශ්වාස කොට පිණක් නොකොට; .... යමයා, මරුවා,

භාවාර්ථ: බුදුසරණ විශ්වාස කොට පිනක් නොකර ඉන්නේ කුමට ද? මරණය පැමිණෙන කලට මරුවාට කැමැති-සේ කැඳවා ගෙණ යන්ටද? නුවණින් විමසා හොඳ ක්‍රියාවන් හා දන් පින්ද කළහොත් හොඳ නේද? කියන්න නෑසිනි! ඇඬීම කුමන මෝඩ කමක් ද? මැරෙන්ට නොදී නවතා ගන්ට වත්ද?

විග්‍රහ: සරණ, පිහිට, බුදු - දම් - සඟ යනුවෙන් සරණ තුණකි.

56 අඬාලා කම්පාව උන්නත්
ඉතින් දුක්මක් නොව න්නේ
නනාලා සිත පිනක් නොකරම
කිම්ද? උපයා තබ න්නේ
දමාලා යන නරක කුණුකය
කුමටදෝ සැප විඳි න්නේ
දිනාලා සුර පුරට යනනට
මකී මේ බණ අස න්නේ

අන්වය: අඩාලා කම්පාවැ උන්නත් ඉතින් දැක්මක් නොවන්නේ සිත තනාලා පිනක් නොකරම උපයං තබන්නේ කිම්ද? දමාලා ඝන නරක කුණුකය සැප විඳින්නේ කුමටයේ? දිනාලා සුරපුරට යන්නට මකි මේ බණ අසන්නේ.

පදාර්ථ: අඩාලා, හඬා; කම්පාවැ, කම්පාවී; උපයං, රැස්-කැර; දමංලා, හැරදමා; ම කි, මවිසින් කියූ;

භාවාර්ථ: හඬා කම්පාවී උන්නත් ඉතින් දැක්මක් නොවන්නේය. සිත තැන්පත් කොට ගෙන පිනක් නොකර (වස්තුව) රැස්කර තබන්නේ කිම්ද? මෙලොව හැරදමා ඝන නරක කුණු කසින් සැප විඳින්නේ කුමකටද? පාපයෙන් ජයගෙන දිව්‍ය ලෝකයට යනු පිණිස මා කී මේ බණ අසන්න.

57 සි ටි න ඇවිණ ගෙණ මෙ සසර බි ළියේ
වි ඳි න මෙ සැප ජරයෙන් තැළි තැ ළියේ
ද කි න නැටුම් වැනි විදුලිය එ ළියේ
මෙදූන නොකර කුසලට කම්මැ ළියේ

අන්වය: මෙ සසර බිළියේ ඇවිණ ගෙණ සිටින ජරයෙන් තැළි තැළියේ විඳින මෙ සැප විදුලිය එළියේ දකින නැටුම් වැනි මෙ දූන කුසලට කම්මැළි නොකර.

පදාර්ථ: බිළියේ, බිළි කොක්කෙහි; ඇවිණ, ඇමිණී ජරයෙන්, ජරායෙන්; තැළි තැළියේ, පීඩිත වෙමින්;

භාවාර්ථ: මේ සංසාර නමැති බිළී කටුවෙහි ඇමිණී ජරාවෙමින් පීඩිත වෙමින් විඳින මේ පස්කම් සැප විදුලි ආලෝකයෙන් බලන නැටුම් වැන්න. මේ බව දැන කුසල් කිරීමට අලස නොවව්.

විග්‍රහ: විදුලිය එළිය වැටුන සැනෙකින් නැතිව යයි. එහෙයින් එළිය වන් කෙණෙහිම බලාගත යුතුය. පස් කම් රස විඳීමද විදුලිය එළියෙන් නැටුම් බලන සෙයින් ක්ෂණික සුඛයට හේතු වන්නකි.

58 දන් පින් බැරි දේකැයි නොසිත න්නේ
අන් කළ පින් අනුමෝදන් ව න්නේ
උන් ලද පින් සරි පින් ලැබ ග න්නේ
ඉන් වද සග මොක් සැප සාද න්නේ

අන්වය: පහසුයි.

පදාර්ථ: අන් කළ, අනුන් කළ;

භාවාර්ථ: දානාදි පින්කම් තමාට කළ නොහැකි දේයයි නො සිතිය යුතු. අනුන් කළ පින් අනුමෝදන් වීමට ද පුළුවන. එයින් පින් කළ වුන්ට සමාන වූ පින් තමාට ද ලැබිය හැකිය. මෙසේ පින් අනුමෝදන් වීමෙන් සග මොක් සැප අත් කර ගත යුතුය.

විග්‍රහ: පින් අනුමෝදන් වීම:– අනුන් කළ පින අසා සමාදරයෙන් තමා ත් ලබා ගැනීම අනුමෝදන් වීමයි. මේ බොදු දහමේ එන දස පින් කිරිය යෙන් එකක් වේ.

59 ස ය ට වේද රස මුසු බත් ක න්නේ
ග ඳ ට වේද ඇඟ සුවඳ කර න්නේ
ලෙඩට බේත් මේ මෙලොව සතු න්නේ
කු ම ට මීට සැපයෙකැයි සිත න්නේ

අන්වය: රස මුසු බත් කන්නේ සයට වේද ඇඟ සුවඳ කරන්නේ ගඳට වේද මේ මෙලොව සතුන්නේ ලෙඩට බේත්. මීට සැපයෙකැයි සිතන්නේ කුමට?

පදාර්ථ: රස මුසු, රසයෙන් මිශ්‍ර; වූ ගඳට, දුගඳයට; සයට, කුස ගින්නට;

භාවාර්ථ: රසවත් ආහාර වළඳනුයේ බඩගින්නට ය. ඇඟ සුවඳ ගල්වනුයේ දුගඳය නිසාය. මේ මෙලොව සතුන්ගේ කුස ගිනි – දුගඳ යන ලෙඩට බෙහෙත් ය. මීට සැපයයි සිතන්නේ ඇයි?

60 මානෙන් ඉඳිතත් මේ සැප පෙරු මය
සීනෙන් ගෑ සුවඳක් මෙන් බොරු මය
දානෙන් සීලෙන් නොකළොත් දරු මය
පානෙන් අඳුරට ගෙන යයි කරු මය

අන්වය: මේ සැප පෙරුමය මානෙන් ඉඳිතත් සීනෙන් ගඳ සුවඳක් මෙන් බොරුමය. දානෙන් සීලෙන් දරුමය නො කළොත් කරුමය පානෙන් අඳුරට ගෙනයයි.

පදාර්ථ: පෙරැමය, උතුම් යයි; මානෙන්, අහංකාරයෙන්; දරැමය, ධර්මය; කරැමය, කර්මය;

භාවාර්ථ: මේ සැප උතුම් යයි මාන්නයෙන් ඉඳිකත් එය හිනෙන් ගැ සුවඳක් සේ බොරුවක් මැයි. දනයෙන් සීලයෙන් ධර්මය නො කළහොත් සත්ත්වයා පහන් එළියෙන් අඳුරට ගියාසේ අකුශල කර්මය විසින් සතර අපායට හෙළනු ලබයි.

61 දර රුස ගිනි ඇවූළුනු කල නිබ දේ
ගිනි මිස දර යයි යන බස නොයෙ දේ
එම ලෙස එක් කොට වදහළ මුනි දේ
දුක මිස කයකැයි යන බස නොයෙ දේ

අන්වය: පහසුයි.

පදාර්ථ: දරරුස, දර සමූහය; නිබදේ, නිරන්තරයෙන්; ගිනි ඇවිළුනු කල, ගිනි ඇවිලි කල්හි; ගිනිමිස, ගිනි විනා; දරයයි, දර යයි; යන බස, යන මේ වචනය; නො යෙදේ, යෙදෙන්නේ නොවේ; එම ලෙස, එසේ; එක් කොට, එක්රැස් කොට; දුක මිස, දුක විනා, කයකැයි, සිරුරකැයි; මුනිදේ, බුදුන් වහන්සේ; වදහළ, වදාළහ.

භාවාර්ථ: දරගොඩ මුළුමනින් = අතරක් නොතබා ගිනි ඇවිළි කල ගිනි ගොඩය යි කියනු විනා දරගොඩ යයි නො කියති. එසේම මේ ශරීරය දුක් රැසක් මිස ශරීරය කැයි කියනු නුසුදුසු යයි බුදුහු වදාළහ.

62 ඉදිතොත් බෝ කල් ජරයෙන් විසි රේ
නැතහොත් වැද යයි මරු මුව කුහ රේ
මෙ මහත් ජර මර දෙදෙනා අත රේ
මෙ සැපත් සැප යයි ගනිදෝ කව රේ

අන්වය: බෝකල් ඉඳිතොත් ජරයෙන් විසිරේ නැතහොත් මරු මුව කුහරේ වැදයයි. මෙ මහත් ජර මර දෙදෙනා අතරේ මෙ සැපත් සැපයයි කවරේ ගනිදෝ?

පදාර්ථ: බෝ කල්, බොහෝ කාලයක්; විසිරේ, වෙනස් වෙයි; මරු මුව කුහරේ, මාර මුඛ නමැති සිදුරේ;

භාවාර්ථ: බොහෝකල් නොමැරී ජීවත් වුවොත් ජරාවෙන් විරූප ව වෙනස් වන්ට සිදුවේ. එසේ වුවහොත් මරු මුවට යාමට වෙයි. මේ ජරාවත් - මරණයත් දෙක අතරට මැදි වී විඳින සැප සැපයයි සිතා ගන්නේ කවරෙක් ද?

63 අසල් ගෙයක සොරකම් ගිය දවසෙ ක
කුහුල් සිතින් ඉඳිනේ තම ගෙය රැ ක
සියල් සතුන් මරු ගෙන යනු දැකැ දැ ක
කුසල් නොකර ඉඳිනේ ඇයි නොවැ සැ ක

අන්වය: පහසුයි.

පදාර්ථ: අසල් ගෙයක, ළඟ ගෙයක; සොරකම්, සොර කමක්; ගිය දවසෙක, පැහිරී ගිය දිනෙක; කුහුල් සිතින්, ආශං සිතින් = කුතුහල සිතින්.

භාවාර්ථ: ළඟ ගෙදරක සොරකමක් විය යන ආරංචිය පැතිර ගිය දවසක තමාගේ ගෙය රැක ගෙන ආශං සිතින් ඉන්නේය. හැම සතුන් මැරෙනවා බල බලං සැකක් නැතිව කුසල් නොකර ඉන්නේ ඇයි?

විග්‍රහ: තම ගෙය සොරුන්ගෙන් බේරා ගැනීමට ඕනෑකමින් බලා සිටින සත්ත්වයා තම ශරීරය මරුවා ගෙන් මුදවා මොක් සැප විඳීමට විරිය නොකරයි.

64 ගඟ යන ඇත් කුණ ඉඳ මස් රස ටා
සි ඳු මැද වැද්‍ද වැනැසුන මෙන් කපු ටා
ල ද ඉසුරෙහි ලොබ කළ හොත් නොපටා
බ ව සයුරෙන් ගමනෙක් නැත ගොඩ ටා

අන්වය: ගඟ යන ඇත් කුණ ඉඳ මස්රසට සිඳු මැද වැද කපුටං වැනැසුන මෙන් ලද ඉසුරෙහි ලොබ කළහොත් නොපට බව සයුරෙන් ගොඩට ගමනෙක් නැත.

පදාර්ථ: ගඟ යන, ගඟේ පාවී යන;, ඇත්කුණ, ඇත කුණේ මළකුණක් උඩ; සිඳු මැද, සාගර මැද්දෙහි; කපුටං, කාක්කා; ලද, ලැබූ; ඉසුරෙහි, ඓශ්වර්‍ය්‍යයෙහි; බව සයුරෙන, සංසාර සාගරයෙන්; ගමනෙක්, යාමක්;

භාවාර්ථ: ගඟේ පාවී යන ඇත් කුණ උඩ මස් රස විඳිමින් හුන් කපුටා මහ මුහුද මැදට වැදී වැනැසුනේය. එසේම මේ ලැබූ සම්පත් වලට ලෝබ කළහොත් තොපටද සංසාර සාගරයෙන් එගොඩව යාමට නොහැකි වන්නේ ය.

65 ප ර සතුරන් එති එති යන බස ටා
ඇ ර අඹු දරුවන් යන තොප වල ටා
ඝෝර ජර මරු එනු එනු දකැ වෙත ටා
ප ර මාදව ඉඳිනේ ඇයි පින ටා

අන්වය: පර සතුරන් එති එති යන බසට අඹුදරුවන් ඇර වලට යන තොප ඝෝර ජර මරු වෙතට එනු එනු දක පිනට පරමාදව ඉඳිනේ ඇයි?

පදාර්ථ: පරසතුරන්, බිහිසුණු සතුරන්, එති එති යන, එති සි එති සි යන මේ; බසට, වචනයට;.........වලට, කැලයට; .... ඝෝර, ඝෝරවූ; ජර-මරු ජරාව හා මාරයා; වෙතට, ළඟට; එනු එනු, එනවා; දකැ, බලා....... පරමාදව, ප්‍රමාදව; .. .. . පිනටා, පින් කිරීමට;

භාවාර්ථ: පරසතුරන් එතැයි ඇසූ විගසම අඹුදරුවන් පවා හැර දමා කැලයට දුවගොස් පණ බේරා ගැණීම බිය සුළු පෘථග්ජන මිනිසාගේ සිරිතයි. එ සේ වූ තොපි ජරාවත්-මරුවාත් ළඟට එනු බල බලා කුසල් කිරීමට ප්‍රමාද ව ඉඳිහු. ඒ ඇයි?

66 ගඟ වතුරෙහි යන මිනිසකු දුකි නේ
ළඟ කළ ඔරුවට නො නැඟෙන ලෙසිනේ
සඟ මොක් දෙන බණ අදහා නොගෙනේ
දුග තිය වැදූ තොප කිම දුක් විඳි නේ

අන්වය: පහසුයි.

පදාර්ථ: ගඟ වතුරෙහි; ගං වතුරෙහි; දුගතිය, සතර අපායට;

භාවාර්ථ: ගංවතුරෙහි ගසාගෙන යන දුකට පත් මිනිසෙකු සමීපයට කළ ඔරුවට නො නැඟීම පුදුමයකි. ඒ වගේ ම වත්මන් මිනිසා ද සග මොක් සැප දෙන දහම විශ්වාස නොකැර සතර අපායට වැදූ දුක් විඳියි. අනේ ඒ කිමෙක් ද?

67 සිල්ප නැටුම් සේවා කම් පා ත ද
අල්ප දෙයක් උදෙසා විඳිනා ව ද
සිල්ප හඳ රැක්කෝතින් තතු ලෙ ද
කල්ප දහස් සුර සිරි විඳිනේ ව ද

අන්වය: සිල්ප - නැටුම් - සේවාකම් තද පා අල්පදෙයක් උදෙසා වද විඳිනා පහඳ තතු ලෙද සිල් රැක්කෝතින් කල්ප දහස් සුර සිරි විඳිනේ වද?

පදාර්ථ: සිල්ප, සිවුසැටක් ශිල්පයන්ද; නැටුම්, නෘත්‍ය–යන්ද; සේවාකම්, යුධ සේවාවන්ද; තද, බලවත් සෙයින්; පා, ප්‍රකාශකොට; අල්ප දෙයක් උදෙසා, සුළු දෙයක් සඳහා; වද, වද වේදනා; විඳිනා, විඳින්නේය. පහඳ, ප්‍රසන්නව; තතු ලෙද, නියම ලෙසින්; සිල් රැක්කොතින්, සිලය රක්‍ෂා කෙළේ නම්; කල්ප දහස්, කල්ප දහස් ගණනක්; සුර සිරි, දිව්‍ය සැප; විඳිනේ, විඳින්නේ; වද, වේද;

භාවාර්ථ: ශිල්ප - නාට්‍ය - සේවාකම් යන මේ සුළු දේ ගැන වද විඳිනා තොප සිත පහදා නිසි පරිදි සිල් රැක්කොත් දහස් ගණන් කල්පයන්හි දිව්‍ය සැප විඳිනේය.

68 උන්නත් නැඟි සිටිනට බැරි නී රුව
සිටියත් ඉඳිනට බල නැති සී රුව
ජරපත් වූ කල නොතිබෙයි මේ රුව
කරතොත් දන් පින් කර ගන් සී රුව

අන්වය: ජරපත් වූ කල මේරුව නොතිබෙයි. උන්නත් නිරුව නැඟි සිටිනට බැරි. සිටියත් සීරුව ඉඳිනට බල නැති. කරතොත් සීරුව දන් පින් කරගන්.

පාදාර්ථ: පහසුයි. නිරුව, ස්ථිරව; සීරුව, යහපත්සේ; ජරපත් වූ කල, ජරාවට පත් වූ කල්හි;

භාවාර්ථ: ජරාවට පැමිණි කල්හි මේ රූපය නො තිබේ. හිඳගෙන සිටියොත් නැඟිට ගන්නට වාරුව නැත. නැඟිට සිටියොත් හිඳ ගැනීමට ශක්තිය නැත. එනිසා කරනවා නම් දන සීල භාවනා දී පින්කම් කරගන්න.

69 මුන් හැම අඹුදරුවන් උපදින් නේ
පින් බලයෙනි බෝකල් පව තින් නේ
උන් කළ පින් මය උන් රඳවන් නේ
ඉන් සිත ලොබමය තොප පවතින් නේ

අන්වය: මුන්හැම අඹුදරුවන් උපදින්නේ, බෝකල් පව තින්නේ පින් බලයෙනි. උන් රඳවන්නේ උන් කළ පින්මය. ඉන් තොප සිත පව තින්නේ ලොබමය.

පදර්ථය: මුන් හැම අඹුදරුවන්, මේ සියලු අඹුදරුවන්.

භාවාර්ථ: මේ හැම අඹුදරුවන් උපදින්නේත්- බෝකල් ජීවත් වන්නේත් පින්බලයෙන් මැයි. උන් මෙලොව රඳවන්-නේත් උන්ගේ පිනමය. ඔවුන් කෙරෙහි තොපහට ඇත්තේ ලොභය පමණකි.

70 සී ල ගුණේ පිහිටා ගෙණ නොසි දේ
ආල ය කර රකිණා තොප නිබ දේ
බාල පියඹු දරුවෝ නම් මෙ ස දේ
බාල කලට කෙළිනා උතු වළ දේ

අන්වය: සීල ගුණේ පිහිටා ගෙණ නො ඉඳ ආලය කැර. තොප නිබඳ රකිණා බාල පියඹු දරුවෝ නම් මෙ සඳේ බාල කලට කෙළිනා උතු වළඳ.

පදර්ථ: නොසිඳේ, නොසිඳ; නිබඳ, නිතර; බාල, බොළඳ වූ; පියඹු, ප්‍රිය අඹුවන්; දරුවන්, පුත්‍රයන්; කෙළිනා, සෙල්ලම් කරන; උතු වළඳ, පොල්කටු (වැනි වෙති.)

භාවාර්ථ: සීලගුණයෙහි පිහිටාගෙණ නො හිඳ නිතර තොප ආලය කැර රක්නා බොළඳ ප්‍රිය අඹුවන් හා දරුවන් කුඩාකාලයේ සෙල්ලම් කරණ පොල් කටු වැනි වෙති.

71 දු ක් ගෙණ රැස් කළ දන හැර කැමැ ති
නි ක් මෙනු නිරයට නරයන් සිරි ති
දු ක් දෙන අඹු දරුවන් නිති රකි ති
මොක් දෙන පිරිසිදු සිල් නොමැ රකි ති

අන්වය: දුක් ගෙණ කැමැති රැස් කළ දන හැර නිරයට නික්මෙනු නරයන් සිරිති. දුක් දෙන අඹු දරුවන් නිති රකිති. මොක් දෙන පිරිසිදු සිල් නොම රකිති.

පදාර්ථ: කැමැති, කැමැත්තෙන්; රැස් කළ, එක් කළ; දන, ධනය;

භාවාර්ථ: දුකසේ ආශාවෙන් එක් කළ ධනය හැරදමා නරකාදියට නික්මීම මිනිසුන්ගේ සිරිතයි. මොවුහු දුක් දෙන අඹුදරුවෝ නිතර රකිති. මොක් සැප දෙන සිල් නො රකිති.

72 නොලදත් අහරක් සා දුක් දුරු කො ට
නැතුවත් කඩරෙද්දක් එක පට ක ට
බලවත් නිරයේ තද දුක් සිහි කො ට
මදකුත් පසු නොබසිවු තෙපි පින ක ට

අන්වය: සා දුක් දුරු කොට අහරක් නොලදත් එක පට කට කඩ රෙද්දක් නැතුවත් නිරයේ බලවත් තද දුක් සිහි කොට තොපි පිනකට මදකුත් පසු නොබසිවු.

පදාර්ථ: සා දුක්, කුස ගිනි දුක්; කඩ රෙද්දක්, රෙදි කැබෙල්ලක්; නැතුවත්, නැති නමුත්,

භාවාර්ථ: කුස ගිනි දුක දුරුකර ගැනීමට තරම් ආහාරයක් නො ලැබුනත් එක පටකට සෑහෙන පමණ රෙදි කැබෙල්ලක් නො ලැබුනත්, නිරයේ ලැබෙන බලවත් තද දුක් කල්පනා කොට පින් කිරීමට මදක් වත් පසුබට නොවවු.

73 නසතොත් සිත ලොබ අනුවණ කම මය
වසතොත් සැදැහැත්තන් ඇති දෙස මය
දෙසතොත් සඟ මොක් දෙන උපදෙස මය
අසතොත් මුනිඳුන් වදහළ බස මය

අන්වය: පහසුයි.

පදාර්ථ: නසතොත්, විනාශ කරතොත්; සිත, සිතෙහි; ලොබ, ලෝභය ද; අනුවණ දෙස මය, මෝඩකම හා ඊර්ෂ්‍යාව ද යන මොහුමැයි;

භාවාර්ථ: වනසතොත් ලෝභය, මෝහය, ද්වේෂය යන මොවුන් වනසන්න. වාසය කරතොත් ශ්‍රද්ධාවන්තයන් ඇති දේශයකම වසන්න. දේශනය කරතොත් සග සැප හා මොක් සැප දෙන ඔවදන් දෙසන්න. අසතොත් බුදුන් දෙසූ සදහම් මැ අසන්න.

74 වැණුවා නම් බුදු ගුණ වැණුවා මය
තැනුවා නම් තම සිත තැනුවා මය
දෙනුවා නම් දන් පින් දෙනුවා මය
දිනුවා නම් පර ලොව දිනුවා මය

අන්වය: පහසුයි.

පදාර්ථ: වැණුවා නම්, වර්ණනා කිරීම නම්; වැණුවාමය, වර්ණනා කිරීම මැයි. තැනුවා නම්, තැනීම නම්; දෙනුවා නම්, දීම නම්; දිනුවා නම්, දිනීම නම්,

භාවාර්ථ: වැණීම නම් බුදු ගුණ වැණීමය. තැනීම නම් තම සිත තැනීමය. දීම නම් දන් හා පින් දීමය; දිනීම නම් පර ලොව දිනීමය.

75 අසාතොත් නිබොරුය මුනිඳු තෙපුල් මය
හරිතොත් නොතබා දස අකුසල් මය
රකිතොත් සිත පිරිසිදු කොට සිල් මය
දනිතොත් මෙ සියල්ලට මේ කල් මය

අන්වය: පහසුයි.

පදාර්ථ: තෙපුල්, වචන;

භාවාර්ථ: අසතහොත් සත්‍ය වූ බුදුන්ගේ වචනම අසන්න. අත්හරිනවා නම් දස අකුසල් ඉතිරි නොකරම අත්හළ යුතු. රකිනවා නම් සිත පිරිසිදු කොට ගෙණ සිල් ම රැකිය යුතු. දන්නවා නම් මේ සියල්ල කිරීමට මේ කාලය බව දැනගන්න.

76 මෙ ස සර රුකැ දුක් විස පල ගත් අ තු
ලෙ ස ඇති වෙති පව් සිය පලයෙන් යු තු
තොස වඩමින් ඉන් බැහැර නොලා සි තු
ද ස අකුසල් පල අසව මෙයින් ම තු

අන්වය: මෙ සසර රුකැ දුක් විස පල ගත් අතු ලෙස සිය පලයෙන් යුතු පව් ඇති වෙති. ඉන් සිතු බැහැර නොලා තොස වඩමින් මෙයින් මතු දස අකුසල් පල අසව.

පදාර්ථ: මෙ සසර රුක, මේ සංසාර නමැති ගසේ; දුක් විස පල ගත්, දුක් නමැති විස ගෙඩි හැදුනු; අතු ලෙස, අතු මෙන්; සිය පලයෙන්, බොහෝ ගෙඩිවලින්; යුතු, යුක්ත වූ ....

භාවාර්ථ: මේ සංසාර නමැති වෘක්ෂයෙහි දුක් නමැති විස ගෙඩි හටගත් අතු මෙන් බොහෝ විපාක දෙන පව් ඇති වෙති. ඒ නිසා සිත පිටත නො යවා සන්තෝෂය වඩිනය කරමින් මින් පසු දස අකුසල් විපාකය අසව.

විග්‍රහ: දස අකුසල්:-

වචනයෙන් කෙරෙන පවු.

1. මුසාවාදය,
2. කේලාම් කීම.
3. පරුෂ බස් බිණීම.
4. ප්‍රලාප කථා කිරීම.

කයින් කෙරෙන පවු.

5. සතුන් මැරීම.
6. සොරකම් කිරීම.
7. කාමයෙහි වරදවා හැසිරීම.

සිතින් කෙරෙන පවු.

8. දැඩි ආශාව.
9. දැඩි කෝපය.
10. මිථ්‍යාදිටු බව.

77 බුදු බණ අසමින් සිත සත පායේ
කුරු පණ කම් ඇර පිය ඒ පායේ
පර පණ නැසුවොත් කවර උ පායේ
අප මණ දුක් දෙයි සතර අ පායේ

අන්වය: බුදු බණ අසමින් සිත සතපං(යේ) ඒ පායේ කුරු පණකම් ඇරපිය කවර උපායේ පර පණ නැසුවොත් සතර අපායේ අපමණ දුක් දෙයි.

පදාර්ථ: සතපා(යේ), සතසා ගෙණ; ඒ පායේ, ඒ පහකල යුතු වූ; කුරු, කෲර වූ පණකම්, ප්‍රාණඝාතය; ඇරපිය, දුරු කරව; කවර උපායේ, කවර උපක්‍රමයකින් වුවත්; පරපණ, අනුන්ගේ ප්‍රාණය; .... අපමණ, පමණ නැති;

භාවාර්ථ: බුදු බණ අසා සිත සනසා අත් හල යුතු වූ ඒ ප්‍රාණඝාතය දුරුකරව. කවර ලෙසින් වුවත් පර පණ නැසුවොත් සතර අපායේ නොනිම් වූ දුක් දෙයි.

විග්‍රහ: ප්‍රාණඝාතය අංග පසකින් සම්පූර්ණ වෙයි. එනම්: i. පණ ඇතියෙකු වීම, ii. ඒ බව දැනුම, iii. මරණ අදහස, iv. ඒ සඳහා කෙරෙණ උපක්‍රම, v. මැරීම.

78 මැඩියන් නයි මුව ගොදුරුව ඉඳ යා
පණුවන් කන මෙන් රස විඳ විඳ යා
සැලෙමින් ජර ගොර මරුමුව වැද යා
බලමුන් පර පණ වනසන ලෙදයා

අන්වය: මැඩියන් නයි මුව ගොදුරුව ඉඳ රස විඳ විඳ පණුවන් කන මෙන් ජරගොර මරුමුව වැද මුන් පර පණ වන සන ලෙද බල!

පදාර්ථ: නයි මුව, නාගයන්ගේ කටෙහි; ජර ගොර මරු මුව, ජරාව හා ඝොර මාර මුඛයට ද; වැද, වැදී.

භාවාර්ථ: මැඩියන් නයාගේ කටෙහි ගොදුරුව ඉන්නාං ගම්බන්ම රස බල බලා පණුවන් අනුභව කරන්නාං සේ ජරා මාර දෙදෙනාගේ මුඛයට වැදී ගිඳිනා මේ සත්ත්වයා ද අනුන්ගේ ප්‍රාණය නසන හැටි බලව.

79 බල යෙන් වත් කිසියම් සොර සිත කින්
සි ය ති න් වත් දැන්වූ උප දෙස කින්
ප ර ස න් තක දෙය ගත සොර සිත කින්
නිර යෙන් නිරයට පැමිණෙයි එතෙ කින්

අන්වය: කිසියම් සොර සිතකින් බලයෙන් වත් සිය අතින් වත් දැන් වූ උපදෙසකින් (වත්) පරසන්තක දෙය සොර සිතකින් ගත එතෙකින් නිරයෙන් නිරයට පැමිණෙයි.

පදාර්ථ: පරසන්තක, අනුන් අයත්;

භාවාර්ථ: බලයෙන් හෝ සොර සිතකින් හෝ තමාගේ අතින් හෝ අනුන්ගේ කීමකට උපදේශයකට හෝ සොර සිතකින් අනුන් අයිති දෙය ගත හොත් එපමණකින් නරක යෙන් නරකයට පැමිණ දුක් විඳියි. සොරකම අංග පසකින් සම්පූර්ණ වෙයි. එනම්:- 1. පරසන්තකවීම. 2. ඒ බව දැනීම. 3. සොර සිත. 4. උපක්‍රමය. 5. ගැනීම.

80 ලොබිනා මිහිරිවැ සොරකම් කළ ස ත
වි දි නා දුක් මේ ලොව මෙතෙකැයිනැ ත
මෙ දිනා ඒ දැකැ දැකැ ඉන් නො නැවැ ත
ඉ දි නා කල කිකලෙකැ වේද්දෝ සෙ ත

අන්වය: ලොබිනා මිහිරිවැ සොරකම් කළ සත මේ ලොව විඳිනා දුක් මෙතෙකැ යි නැත. මෙදිනා ඒ දැකැ දැකැ ඉන් නො නැවැත ඉඳිනා කල කිකලෙකැ සෙත වේද්දෝ?

පදාර්ථ: මිහිරිව, මධුර වශයෙන් සලකා ගෙන;

භාවාර්ථ: ලෝභයෙන් සොරකම් කළෝ මේ ලොව දුකට පැමිණෙති. ඒ බල බලා සොරකමින් නොවැළකී ඉඳිතොත් කවදා යහපතක් වේද?

81 අ සූ කොට ගත නො තබති ආදා රය
වද කොට මැරුවත් නැති එ විචා රය
ලඟු කොට නො සිතවූ පව් පරදා රය
නි ර ය ට ඇදගෙන යන එම පා රය

අන්වය: අඳුකොට ගත ආදරය නොතබනි. වදකොට මැරුවත් එ විචාරය නැති. පරදරය පව් ලඟුකොට නොසිතාවු. එම් නිරයට ඇද ගෙන යන පාරය.

පදැණි: විචාරය, පිළිවිසීමක්; විමසා බැලීම; ලඟුකොට, සැහැල්ලු වශයෙන්.

භාවාණි: අල්වා ගත්තොත් ආධාරයක් සඳහා ඉඩක් නොතබති. වධයට පමුණුවා මැරුවත් ඒ ගැන විමසීමක් නැත. පරස්ත්‍රී හා පර පුරුෂ සේවනය සුළු වශයෙන් නොසිතවු. එම පාපය නරකයට ඇද ගෙන යන මහ පාරය.

විග්‍රහ: කාම මිථ්‍යාචාරය අංග සතරකින් සම්පූර්ණවේ. 1. නොපැමිණිය යුතු ගණියේ කාන්තාවක් වීම. 2 සේවනය සඳහා අදහස. 3. උපක්‍රමය. 4. සෙවන රසය ඉවසීම.

82 අසවා මකියන බස් අර තර යේ
මුසවා බස් කිවා එක මුර යේ
වසවා දෙව්ලොව යන මං තර යේ
පැසවා මිස නාරී ඝොර නිර යේ

අන්වය: මකියන බස් අරතරයේ අසවා එක මුරයේ මුසවා බස් කිවා දෙව්ලොව යන මං තරයේ වසවා ඝොර නිරයේ පැසවා මිස නාරී.

පදැණි: මකියන, මවිසින් කියනු ලබන; බස්, වචන; අරතර යේ, දෘඪතර වැ; අසවා, අසාවා; එක මුරයේ, එක වරක්; මුසවා, මුසාවාද; කිවා, කීවොත් .. ..මං, මඟ; තරයේ, සවිරව මැ; වසවා, වසවත්නේය. ඝොර, ඝොර වූ,........පැසවා මිස, පැහී මිසක්; නාරී, (නො + අරී) නොහරියි.

භාවාණි: මා විසින් කියන වචන දෘඪතරවම ආසාවා! එක වරක් බොරු කී අය දෙව්ලොවට යන පාර වස්වයි. නිරයේ පැහී මිස අත් නොහරී.

විග්‍රහ: මුසාවාදය අංග සතරකින් සම්පූර්ණවේ. එනම්:–
i. බොරු බව ii. ඇත්ත සඟවන අදහස iii. උපක්‍රමය iv- බොරුව යයි දැනීම.

කේළාම් කීම

83 පලදෙන පින් පව් දෙක නොබලා මේ
පව සත බස් උර සක් මාලා මේ
බිඳු වන බස් වැඩ නැති කේළා මේ
මතු වන දුක් නොදැනෙන වේලා මේ

අන්වය: පලදෙන පින් පව් දෙක නොබලා මේ පවසන බස් උරසක් මාලාමේ බිඳුවන වැඩනැති බස් කේළාමේ මතුවන දුක් වේලාමේ නොදැනෙන

පදාර්ථය: පලදෙන, විපාකදෙන; උරසක්මාලා මේ, උරචක්‍ර මාලාවක් වැනිය; බිඳුවන, භෙද කරවන; වැඩ නැති, නිෂ්ප්‍රයෝජන; බස්, වචන, කේළාම්, කේළාම් ය.

භාවාර්ථ: විපාක දෙන පින් පව් නොසලකා මේ ප්‍රකාශ කරණ වචන උරචක්‍ර මාලාවන් වැනියහ. උතුන් බිඳුවන වැඩක් නැති ඒ වචන කේළාම් නම්. ඉන් මතු කාලයෙහි ඇදුවන දුක් මේ කාලයේ නොදැනෙයි.

විග්‍රහ: කේළාම්:– අනුන් භෙද කරන නිසරු තෙපුල් කේළාම් නම් වේ. ඒවා උර චක්‍රමාලා වැනියහ.

උරසක්මාලා: මාලාවක් වැනි සටහන් ඇති මුවහත් ආයුධ විශෙෂයකි. මෙය හිසින් ලූකල්හි උරයට වැටී කර කැවී කැවී ශරීරය කපා ගෙන පහතට බසී. කේළාම් වචනද එසේය.

පරුස බස් පැවැසීම

84 ඇවිස නො කී බස් කණට යවුල් ලෙ ස
සිත ස තොසින් කිය කියතොත් පිය බස
පරුස තෙපුල් බිණුවා නම් මහ දෙස
ඒ විස නො යයි පර ලොව දුක් දී මිස

අන්වය: කණට යවුල් ලෙස ඇවිස බස් නොකී. කියතොත් පියබස සිත සතොසින් කිය. පරුස තෙපුල් බිණුවා නම් මහදෙස එවිස පරලොව දුක්දී මිය නොයයි.

පදාර්ථ: යවුල් ලෙස, යකඩ හුල් වැනි; ඇවිස බස, ආක්‍රොශ වචන; නො කී. නොකියව. පියබස, ප්‍රිය වචන;........ පරුෂ තෙපුල්, පරුස වචන; බිණුවා නම්, කීයේ නම්; මහදෙස, මහා දෙෂයි; එවිස ඒ වචනවල විස............

භාවාර්ථ: ආක්‍රොශ වචන=රළු කරළු බස් නොකියව - එවා කණට යකඩ උල් වැනි වේ. ප්‍රිය වචන කථාකරන්න. පරුෂ කථා කිරීම මහා දෙෂයි. එහි විෂ පරලොව දුක් දීමෙන් විනා අන් ලෙසින් නොයයි.

හිස් බස් බිණීම

85 පෙර සිට වියතුන් නො කියා වැළැ කී
දෙලෙ වට වැඩ නැති බස් අකුසල කී
කෙළි ය ට වත් ඒ වැඩ නැති බස කී
නි ර ය ට වැද යන රජමහවත කී

අන්වය: පෙරසිට වියතුන් නො කියා වැළැකී දෙලොවට වැඩනැති බස් අකුසලකී. කෙළියට වත් ඒ වැඩ නැති බසකි නිරයටවැදයන රජමහවතකි.

පදාර්ථ: වියතුන්, උගතුන්; කෙළියට වත්, විහිළුවට වත්; නිරයට, නරකයට; වැද යන, වැදීයන; රජමහවතකි, ප්‍රධාන මහ පාරකි.

භාවාර්ථ: ඉස්සර පටන් උගතුන් නොකියා අත්හළ මෙලෝ පරලෝ දෙකටම ප්‍රයෝජන නැති වච්‍යා කථා කිරීම අකුසලයකි. සෙල්ලමටවත් ඒ හිස් වචන කථා කිරීමෙන් පලක් නැත්තේය. ඒ නිරයට යන ප්‍රධාන මාර්ගයකි.

දුඩි ලෝබය ඉපදවීම

86 අ න් සතු සැපතක් දැකැ දළ ලොබි නේ
උ න් ට නොවී මට වේවයි සිති නේ
හු න් කලැ ඒ සිත හටගත් පවි නේ
උ න් මතු නිරයේ දුක්මැයි විඳි නේ

අන්වය: අන්සතු සැපතක් දැකැ දළ ලොබිනේ උන්ට නොවී මට වේවයි සිතිනේ හුන් කල ඒ සිත හටගත් පවිනේ උන් මතු නිරයේ විඳිනේ දුක්මැයි.

පදාර්ථ: අන්සතු, අනුන් අයත්: .... දළ ලොබින්, දැඩි ලෝභයෙන්;......සිතිනේ, සිතින්; හුන් කල, හුන් කල්හි; ...

භාවාර්ථ: අනුන්ට අයිති සැප දැකැ ඒ කෙරෙහි තද ආශා වෙත් ඒ සැපත ඔවුන්ට නොලැබී අනේ මට වේවායි යන ලොභ සිතින් වාසය කරණ කල්හි ඒ සිතැ උපන් දැඩිලොභ අකුශලයෙන් අනාගතයෙහි නරකාදියට ගොස් විඳින්නේ දුක් මැයි.

ක්‍රෝධ සිත් ඉපැදවීම

87 රි සි නූ දනහට කැරුවා දේයා
නසි වයි යන සිත වැ පා දේයා
බ සි නා නිරයට ඒ පා දේයා
කිසි කලෙකත් ඒ ඒ පා දේයා

අන්වය: රිසිනූ දනහට වාදේයා කැරු නසිවයි යන සිත වැපාදේයා. ඒ නිරයට බසිනා පාදේයා ඒ කිසි කලෙකත් ඒ පාදේයා.

පදාර්ථ: රිසි, කැමැති; නූ, නොවූ; දනහට, ජනයාට; වාදේයා කර, වාද කොට; නසිවයි, මැරේවායි යන සිත, යන සිතිවිල්ල වැපාදේයා. ව්‍යාපාදය නම්. ඒ, ඒ ව්‍යාපාද සිත; ..... පාදේය. පාදයකි. ඒ ඒ පාදේයා, ඒ එපා දෙයකි.

භාවාර්ථ: තමන් කැමැති නැති අය නසීවායි කල්පනා කිරීම ව්‍යාපාද නම්. එය නරකාදියට බසින පාදයක් වැන්න. කිසිම කලෙක එය උපදවා නොගත යුතු එපා කළ දෙයකි.

මිස දිටු ගැනීම

88 නිවණට මඟ මේ යයි මුනි කී යම්
දහමට වෙන් වූ දෙසැටක් සම යම්
සරිකොට ගත් සිත වෙයි මිසදිටු යම්
සසරට බිජුවට මැයි ඒ සම යම්

අන්වය: නිවණට මග මේයයි මුනි කී යම් දහමට වෙන් වූ දෙසැටක් සමයම් සරිකොට සිත ගත් යම් මිසදිටු වෙයි. ඒ සමයම් සසරට බිජුවට මැයි.

පදාර්ථ: නිවණට මග; නිවන් යන මාර්ගය; යම්දහමට, යම් ධර්මයකට; වෙන් වූ: අන්‍ය වූ; දෙසැටක් සමයම්, හැට දෙකක් ආගම්; සරි කොට සත්‍යවශයෙන් පිළිගෙණ; සිත ගත්; සිත පහවුරු කොට ගත්; යම් මිසදිටුවෙයි; කිසියම් මිථ්‍යා දෘෂ්ටියක් වෙයිද; ඒ සමයම්; ඒ ආගම්;.....බිජුවට මැයි බීජයක් මැයි.

භාවාර්ථ: නිවන් මග මේයයි බුදුහු වදාළහ. ඒ දහමට වෙනස් දහම් හැට දෙකකි. ඒ හැට දෙකත් මිථ්‍ය ආගම් හොඳයයි සත්‍යයයි සිත තබා ගැනීම මිථ්‍යාදෘෂ්ටි යයි. මිථ්‍යා දෘෂ්ටිය සංසාරයේ ඉපැද්මට බීජයක් හෙවත් ඇටයක් වැන්න.

89 නොයෙකි රස බිමැ නිඹ බිජුවට ලත
ඒ මැ කී සිටිනෙයැ තිත් තව පල ගත
මෙ ම කි මිස දිටු අදහස් ඇති සත
කා ළ කි දෙය අකුසල මිස පින් නැත

අන්වය: නොයෙකී රසබිම නිඹ බිජුවට ලත පලගත ඒමැකී තිත්තව සිටිනෙය. මෙම කී මිසදිටු අදහස් ඇති සත කළ කී දෙය අකුසල මිස පින් නැත.

පදාර්ථ; නොයෙකී, බොහෝ; රස බිමැ, රස සහිත පොළොවෙහි; නිඹ බිජුවට කොහොඹ ඇටය; ලත, ලූකල්හි (දැමූ කල්හි) පලගත පලගත්, කල්හි; ඒ මැකී, ඒ රස මැකී; තිත්තවැ, තිත්ත රසැතිවැ.

භාවාර්ථ: බොහෝ රස ඇති පොළොවේ කොහොඹ ඇටයක් සිටුවා ඉන් පැල නැගී පලදරු කල්හි ඒ ගෙඩි පෘථිවි රසය මැකී ගොස් කොහොඹ ඇටේ රසය වූ තිත්ත රසින් සිටී. මිසදිටු අදහස් ගත් සත්ත්වයා කරණ කියන හැම දෙයක්මැ මේ ආකාරයෙන් අකුසල් මිස පිනක් නොවේ.

90 නට සිල් මිසදිටු ගත් අය කැමැ නී
හට ගත් කප් ගිනි කඳ මැද පැසෙ නී
අට මහ නරකය පැසුනත් නොමැ නී
පිට සක්වළ එක් පෙදෙසෙක පැසෙ නී

අන්වය: නටසිල් කැමැති මිසදිටු ගත් අය හටගත් කප් ගිනි කඳ මැද පැසෙති අටමහ නරකය පැසුනත් නො මැති. පිටසක්වළ එක් පෙදෙසක පැසෙති.

පදාර්ථ: නටසිල්, සිල් නැතිව; කැමැති, කැමැත්තෙන්; මිසදිටුගත් අය; මිථ්‍යාදෘෂ්ටි ගත් අය; හටගත්, හටගත්; කප් ගිනි කඳ මැද, කල්පාංගනිය මැද; පැසෙති, පැහෙති; අට මහ නරකය, අට වැදූරුම් මහා නරකයෙහි; පැසුනත්, පැසුනේ නමුදු; නොමැති, අවසානයක් නැත; පිටසක්වළ, මේ සක්වළින් පිට; එක පෙදෙසක, එක්තරා ප්‍රදේශයක; පැසෙති, පැසෙත්;

භාවාර්ථ: මිථ්‍යාදෘෂ්ටිය ගත් අය කල්පය අවසානයේ උපදනා ගින්නෙන් පැසී පසුව අට මහා නරකයෙහි ද පැසී එත් මඳවැ පිටසක්වළ ඉපද දුක් විඳිමින් පැහෙති.

විග්‍රහ: අටමහා නිරය; යට දක්විමු.

දස අකුසල විපාක

91 මේ දස අකුසලි ඉනෙකක් කළහො ත්
උප දෙ ස කින් බසෙකින් කරවූව හො ත්
එ වි ග ස එක් අදහසකින් සිතූ වො ත්
නොවලස මොහු හැම දෙන නිරයටයෙ ත්

අන්වය: මේ දස අකුසලි. ඉන් එකක් කළහොත් උපදෙස කින් කරවූවහොත් එවිගස එක් අදහසකින් සිතුවොත් නොවලස මොහු හැම දෙන නිරයට යෙත්.

පදාර්ථ: පහසුයි.

භාවාර්ථ: මේ ඉහත දැක්වූයේ දස අකුසල්ය. මෙයින් එකක් කළහොත් නැත්නම් කිරීමට උපදෙස් දුන්නොත් නැත-හොත් වචනයෙන් කියා අනුන් ලවා කරවූවහොත් එකෙනෙහිම සිතුවොත් ඒ කරන උපදෙස දෙන - කරවන - සිතන - හැම දෙනාම ඉක්මණින් අපායට පැමිණෙති.

විග්‍රහ: ඉහත සඳහන් දස අකුසල් කිරීම - කිරීමට උපදෙස් දීම - කරවීම - කරන්ට කල්පනා කිරීම- යන මෙයින් ඒ පාප කර්මයට අසුවෙයි. ඔහු හැම අපායට යෙති.

අකුසල් රග

92 ක ර ද ර දස අකුසලයෙන් නොමි දී
වැ ර සැ ර පැවොත් මෙ මිනිස් ලොව දී
මෙර ගි ර මුදුනින් හුනු මෙන් නොරු දී
ප ර තෙර නැති දුක් සයුරේ කිමි දී

අන්වය: කරදර දස අකුසලයෙන් නොමිදී මෙ මිනිස් ලොවදී වැරසැර පැවොත්, මෙරගිර මුදුනෙන් නො රුදී හුනු මෙන් පරතෙර නැති දුක් සයුරේ කිමිදී.

පදාර්ථ: කරදර, කරදර ඇති කරණ; නො මිදී, නො ගැලවී; වැරසැර පැවොත්, චණ්ඩ කම් පැවොත්; මෙරගිර මුදුනින්; මහා මේරු පර්වතය මුදුනින්; හුනුමෙන්, වැටුනාක් සේ; නො රුදී, අතරක නොරඳා; පරතෙර, කෙළවරක්, දුක් සයුරේ; දුක් නමැති සාගරයේ, කිමිදී, ගිලෙයි.

භාවාර්ථ: කරදර උපදවන දස අකුසලින් නො ගැලැවී මේ මිනිස් ලොවේදී තදකම්පා එය කළහොත් මහමෙර මුදුනින් වැටු-නාක් මෙන් සීමාවක් නැති දුක් සයුරට වැටී එහි ගිලෙයි.

93 බුදු වත් මෙනෙකැයි නොකියැකි පිරි සි දැ
බල වත් මහ දුක් විඳුවන හැම ස දැ
සිතු වත් බිය වන අට මහ නිරය දැ
ඔසු පත් සහ ඒක්සිය සතිසෙක් ව දැ

අන්වය; පහසුයි.

පදාර්ථ: බුදුවත්, බුදු බවට පත්වී වුවත්; පිරිසිඳ; වෙන් වශයෙන් කොටස් කැරැ; නොකිය ඇකි, කිය නොහැකි; හැම සඳ, නිතර; ඔසුපත්, නරකාදි අවට ඇති නරකාදී; එක්සිය සතිස, එක් සිය තිස් හයක්; වද, වේද;

භාවාර්ථ: බුදු වුවත් මෙපමණ යයි වෙන්කැරැ නො කිය හැකි බලවත් මහ දුක් හැම කාලයේ ම විඳුවන සිතිම පවා මහා බිය ජනක වූ මහ නරකාදි අටත් ඔසුපත් නරකත් සියල්ල නරකාදි 136 කි.

විග්‍රහ: එක්සිය සතිස් නිරය යටැ දුක්විමු.

නිරා දුක.

94 තෙ සි ය ක් තෙප් මුණ වැද සිදුරුව ගත
ද ව ස ක් මිනිහෙක් විඳි දුක් නොනැවැත
මොහොතක් නිරයේ විඳිදුක් සම වත
අ බැ ට ක් හා සරි නොවෙද්දෝ හිම වත

අන්වය: තෙප් මුණ තෙසියක් වැද ගත සිදුරුවැ නො නැවැත මිනිසෙක් දවසක් විඳිදුක් සමවත අබැටක් හා හිමවත සිරි නොවේදෝ?

පදාර්ථ: තෙප්මුණ, අඩයටි මුහුණත; තෙසියක්, තුන් සියයක්; වැද, වැදී; ගත, සිරුර; සිදුරුව, සිදුරු වී; නො නැවත, නිමක් නැතිව, ... මොහොතක්, මුහුර්තයක් ප්‍රමාණ වේලාවක්; ....සමවත, සම කරතහොත්; අබැටක්, අබ ඇටයක්; හා, සමග; හිමවත, හිමාලය පර්වතය; සරි, සමාන;

භාවාර්ථ: අඩයටියකින් අනිනු ලැබ ශරීරයේ 300 පළක් සිදුරු වී මිනිහෙක් විඳිදුක නිරයේ මොහොතක් විඳි දුකට සමාන කරනවා නම් ඒ අබ ඇටයක් හිමාලය පර්වතය හා සමානය යී පවසන්නා වැනිය. අඩයටියෙන් වූ තුවාල නිසා විඳිනා දුක ඉතා සුළු දුකකි. එය නිරයේ මොහොතක් විඳිනා දුකටද සම කළ නොහැකිය.

විග්‍රහ: තෙප්:- පැරණි යුද වලදී භාවිත කළ අනිතාං අංගුධයකි.

සතුන් මැරීමේ විපාක

95 පෙර අඟ නක් එක් එළුදෙනක හිස සිඳු
සිය ලඟ වැළඳි ගිනිදැල් නිරය දුක් විඳු
ඇය ඇඟැ ලෝම ගණනේ හිස් කැපුම් ලදු
මෙම රඟ වේයැ කාටත් අකුසලේ මෙදු

අන්වය: පෙර අඟනක් එක් එළුදෙනක හිස සිඳා සියලු ඇඟ ගිනිදැල් වැළඳි නිරය දුක් විඳ ඇඟ ලෝම ගණනේ හිස් කැපුම් ලද කාටත් අකුසලේ ලෙද මෙම රඟ වේය.

පදාර්ථ: අඟනක්, කාන්තාවක්; සිඳා, කපා; සියලඟ, සියළු ශරීරය; ගිනිදැල්, ගිනිසිළු; වැළඳී, වෙළාගෙන;...........රඟ, ආකාරය;

භාවාර්ථ: ඉහත කාන්තාවක් එක් එළු දෙනකගේ හිස කැපිය. ඒ පවින් ඈ මරණින් මතු නිරයේ ඉපද සියලු ශරීරය ගිනිදැල් වෙලී ගොස් මහත් දුකට ගොදුරු වූවාය. පසු ඈ උප උපන් ජාතියෙහි එළුදෙනගේ ඇඟ ලෝම ගණනට හිස් කැපුම් කා මරණයට පත්වූවාය. අකුසල් කිරීමෙන් විපාක දෙන ආකාරය මේය. කාටත් මේ එකාකාරයි.

සතුන් මැරීමෙන් ලද විපාකය මෙයින් පැහැදිලි වේ.

සොරකම් කිරීමේ විපාක.

96 කෙළි යට කඩක් සඟවා යහළුවකු ගෙ නේ
එ ළි කොට නැවත දුන් මිනිසෙකුට එතෙකි නේ
වි ළි වැස්මක් නොමවිය දෙවි වූවත් අ නේ
කෙළි යටවත් නොකරව් සොරකමක් දූනේ

අන්වය: කෙළියට කඩක් යහළුවෙකුගෙන් සඟවා එළිකොට නැවත දුන් මිනිසෙකුට එතෙකින් දෙවි වුවත් අනේ! විළි වැස්මක් නොම විය. දූනේ කෙළියට වත් සොරකමක් නොකරව්.

පදාර්ථ: කෙළියට, සෙල්ලමට; කඩක්, රෙදි කැබෙල්ලක්; ....එළිකොට, සොරකම් කළ බව ප්‍රකාශ කොට;

භාවාර්ථ: මිනිසෙක් තම ගහළුවෙකුගෙන් සෙල්ලමට රෙදි කැබැල්ලක් සොර කම් කොට නැවතත් ඒ බව කියා ඔහුටම දුන්නේ ය. ඒ පාපයෙන් ඒ මිනිසා දෙවියෙක් වැ ඉපදත් විළි වසා ගන්නට රෙදි කඩක් නොලැබ ගෙළුවෙන් විසිය. එනිසා සෙල්ලමට වත් සොරකම් නොකරව්.

කාමයෙහි වරදවා හැසිරීමේ විපාක.

97 නොනැවැති අයෙක් පෙර
පරදර පව් කැමැ ති
ගු ගු ර ති ගැලෙති තිස්වාදහ
සින් උඩෙ ති
හිම් නැ ති තවම ලෝකුඹු
නිරයේ පැහෙ ති
නො ක ර ති මෙපවු නුවණැති
අය වැඩ කැමැ ති

අන්වය: පෙර පරදර පව් කැමැති නොනැවැති අයෙක් ගුගුරති. ගැලෙති. තිස්වාදහසින් උඩ එති. හිම් නැති ලෝකුඹු නිරයේ තවම පැහෙති. වැඩ කැමැති නුවණැති අය මෙ පවු නොකරති.

පදාර්ථ: කැමැති, කැමැත්තෙන්; පරදර පව්, පරදර පාපය; නො නැවැති, නො නවතා මැ කළ; ගුගුරති, ගර්ජනා කරති. ගැලෙති, ගිලෙති; තිස්වා දහසින්, අවුරුදු තිස්දහ-කින්; (වරක්) උඩ එති, උඩට එති.

භාවාර්ථ: ඉහත අනුන්ගේ අඹුවන් කරා ගොස් සේවනය කළ අයෙක් ලෝකුඹු නම් නරකාදියේ වැටී ගර්ජනා කරති. ගිලෙති. වම් තිස්දහස කින් වරක් උඩට එති. තවම මොවුහු මෙදුක් විඳිති. හිත වැඩ කැමැති ගුණවත් අය මේ පවු නොකරත්.

බොරුකීමේ විපාක.

98 ලැ දි වැ රජෙක් බොරු
බස් කී විගස කයා·
නැ ති වැ රිද්දි බලයත්
ඒ මිනිස් කයා·
පොළොවැ පලාගෙන ගොස්-
වැටුනි නර කයා·
මෙ ලො වැ සතුනි ඉන්
බොරු කිම නර කයා·

අන්වය: රජෙක් ලැදිවැ බොරුබස් කී විගසක රිද්දි බලයත් නැතිවැ ඒ මිනිස් කය පොළොව පලාගෙන ගොස් නරකයෙහි වැටුනි. මෙලොව සතුනි ඉන් බොරු කීම නරකය.

පදාර්ථ: ලැදිවැ, ආශාවෙන්; විගසක, කෙණෙහිම; රිද්දි, සෘඩි; නරකය, නිරයේ;

භාවාර්ථ: පෙර රජෙක් ආශාවෙන් බොරු කී විගසම සෘඩි බලයත් නැතිව ඒ ශරීරය පොළොව පළාගෙන නරකයට වැටුනි. මෙලොව වැසි සත්වයිනි! එසේ හෙයින් බොරු කීම නරකය.

කේලාම් කිමේ විපාක

99 පි සුණු කියා සඟ දෙනමක් වෙනස් කොට
පැසු නි එකෙක් නිරයේ කල්පයක් සිට
මූ හුණු කුණුව තව පේතව විදි ගැ හැට
පි සුණු බසක් නොකියවූ අද පටන් සිට

අන්වය: පිසුණු කියා සඟ දෙනමක් වෙනස් කොට එකෙක් නිරයේ කල්පයක් සිට පැසුනි. තව මූහුණු කුණුව පේතවැ ගැහැට විදි අද පටන් සිට පිසුණු බසක් නොකියවු.

පදාර්ථ: පිසුණු, කේලාම්; කල්පයක් සිට, කල්පයක පටන්; තව, තවද; පේත වැ, ප්‍රේතයෙක් වැ;

භාවාර්ථ: එක් අයෙක් කේලාම් කියා සඟ දෙනමක් භෙද කර කල්පයක පටන් කලක් නරකයේ පැසුනි. එපමණක් ද නොව ප්‍රේතයෙකු වැ ඉපද මුහුණ කුණු වී දුක් ගැහැට විඳි. අද සිට එනිසා කේලාම් නොකිය ව.

පරුෑස බස් බිණීමේ විපාක,

100 පෙ ර එක් සගෙක් සඟගණහට
බැණ නපුරු
නි ර යේ වැටි බිම සත්ගව්
වැඩෙන තු රු
ඝොර දුක් විඳි තව පේතව
සිට කුරි රු
ප . ර හට එසින් නොකියවු
බස් නො පියක රු

අන්වය: පෙර එක් සගෙක් සඟගණහට නපුරු බැණ බිම සත් ගව් වැඩෙන තුරු නිරයේ වැටි තව පේතව කුරිරු ඝොර දුක් විඳ එසින් පරහට නො පියකරු බස් නොකියව්.

පදාර්ථ: සගෙක්, සංඝයා වහන්සේ නමක්; නපුරු, නපුරු බස්; බැණ, පවසා; බිම, පොළොව; සත් ගව් වැඩෙන තුරු, ගව් හතක් වැඩෙන තුරු; .. ..කුරිරු, කෲරවූ; ඝොරදුක්; ඝොරදුක්; ....පරහට, අනුන්හට; නොපිය කරු, අප්‍රිය ජනක;

භාවාර්ථ: ඉහත එක් සංඝ නමක් තවත් සංඝ සමූහයකට නපුරු බසින් බැණ බිම ගව් හතක් වැඞීමට ගතවන කාලයට සමාන කාලයක් නාරකයේ වැටී දුක් වින්දේය. එසින් චුතවැ ප්‍රේතයෙක් වී තවත් කෲර දුකට ද භාජනවිය. එනිසා අනුන්ට අප්‍රිය වන පරුෑස බස් නොකියවු.

හිස් තෙපුල් බිණීමේ විපාක.

101 කිවොත් වැඩක් නැති බස්
ඝොර නිරා ගැ බේ
ම හ ත් කුරිරු දුක් විඳ යළි
අවොත් මො බේ
කි ම ත් සැබඳ නොගනිති
ඔහුගෙ බස් ස බේ
ගෙ ව ත් සසර දුක් මෙම
නොකියතොත් සැ බේ

අන්වය; වැඩක් නැති බස් කිවොත් ඝොර නිරා ගැබේ මහත් කුරිරු දුක් විඳ යළි මොබේ අවොත් ඔහුගෙ බස් සබේ කිමත් සැබෑ නොගනිති. මෙම නොකියතොත් සැබේ සසර දුක් ගෙවත්.

පදාර්ථ: නිරා ගැබේ, නරකාදිය ඇතුළේ; කුරිරු, කෲරවූ; යළි, නැවත; මොබේ, මෙලොවට; ....සබේ, සභා මධ්‍යයෙහි; සැබේ, සැබැවින්;

භාවාර්ථ: අර්ථ රහිත වචන කිවොත් ඝෝර නරකාදියෙහි මහා කෲර දුක් විඳ නැවත මෙහි ආවොත් සැබෑව කියේ නමුත් ඔහුගේ වචන සභාවේ පිළි නොගනිති. මේ සම්ඵප්‍රලාප වචන -හිස් තෙපුල් නොකියතොත් සංසාර දුක් ගෙවෙති.

අභිධ්‍යා (දැඩිලොභ) යෙහි විපාක

102 අන් සතු දෙයක් වේවයි සිතුව තමහ ට
ඉන් දුගතියෙහි දුක් විඳ අව මේ ලොව ට
උන් සිතුවක් සිදු නොම වෙයි සිතු ලෙස ට
මි න් මතු සිතක් නොසිතව් එවැනි පවක ට

අන්වය: පහසුයි.

පදාර්ථ: අන් සතු දෙයක් තමහට වේවයි සිතුව ඉන් දුගතියෙහි දුක් විඳ මේ ලොවට අව උන් සිතුවක් සිතු ලෙසට සිදු නොම වෙයි. මින් මතු පවකට එවැනි සිතක් නො සිතවු.

භාවාර්ථ: අතුන් අයත් වස්තුව මට අත්වේවා යි දැඩි ලොභ කිරීම් හේතු වෙන් දුගතියෙහි දුක් විඳ මේ ලොව උපන් කල්හි ඒ සත්ත්වයා සිතනා දෙය එසේ සිදු නො වේ. එවැනි පාප සිතක් මින් පසු ඇති නොකරවු.

ක්‍රොධ කිරීමේ විපාක

103 බෝවාද හස් පැසවන නිරය වෙන වෙ න
වැ පා ද නම් රුදු මන බව නපුරු ව න
ආ බා ද දුක් විඳුවන උප නූපන් තැ න
වැ පා ද යක් නොසිතවු දැන දැන සිතින

අන්වය: වෙන වෙන නිරය බෝවා දහස් පැසවන වැපාද නම් රුදු මන බව නපුරු වන උපනූපන් තැන ආබාද දුක් විඳවන වැපාදයක් දැන දැන සිතින් නො සිතවු.

භාවාර්ථ: වෙන් වෙන් වශයෙන් නිරයෙහි අවුරුදු දහස් ගණන් පැසීමට හේතු වූ ව්‍යාපාද නම් වූ රෞද්‍ර චිත්ත ස්වභාවය නපුරු වෙයි. උපනූපන් තන්හි රෝග පීඩා උපදවන ව්‍යාපාදය සිතින් නොසිතවු.

පදාර්ථ: මනබව, චිත්ත ස්වභාවය; ආබාද, රෝග;

මිසදිටු වීමේ විපාක

104 ක ල ක් නිරා දුක් විඳ
විටෙක ගොඩ දු වූ
නොයෙක් රෝග හටගෙන
ගත වෙයි අරි වූ
උ ද ක් නුවණ නැති වෙයි
සිත වෙයි කිලු වූ
මෙ ව ක් පටන් විස මෙන්
සිතව මිසදි වූ

අන්වය: කලක් නිරා දුක් විඳ ගොඩ දුටු විටෙක නොයෙක් රෝග හට ගෙන ගත අරිවු වෙයි. උදක් නුවණ නැතිවෙයි. සිත කිළුටු වෙයි. මෙවක් පටන් මිසදිටු විස මෙන් සිතව.

පදාර්ථ: අරිටු, අවලක්ෂණ; ගත, ශරීරය; උදක්, ශුළේදක්; මෙවක් පටන්, මෙතැන් පටන්; මිසදිටු, මිථ්‍යා දෘෂ්ටිය; විස මෙන්, විෂයක් මෙන්; සිතව, සිතවු.

භාවාර්ථ: කාලයක් නිරයේ දුක් විඳ ගොඩ දුටු විටෙක දී නා නා රෝග හට ගෙන ශරීරය අවලක්ෂණ වෙයි. ඒකාන්තයෙන් නුවණ නැති වෙයි. සිත කිළුටු වෙයි. මෙතැන් පටන් මිසදිටු විෂමෙන් සිතව්.

පින් පල

105 බව යෙ න් බවයෙහි කෙලෙසුන් නොයෙකි
තොපදැන් විඳිනා දුක් දැන නිසැ කි
ස ස රි න් ගොඩ නැගුමට මුනිඳුන් කි
ලෙස පින් පවසමි ඇසුවොත් යෙහෙ කි

අන්වය: බවයෙන් බවයෙහි නොයෙක් කෙලෙසුන් තොප දැන් විඳිනා දුක් නිසැකි දැන සසරින් ගොඩ නැඟුමට මුනිඳුන් කී ලෙස පින් පවසමි ඇසුවොත් යෙහෙකි.

පදාර්ථ: කෙලෙසුන්, කෙලෙස් දහම්.........නිසැකි, සැක රහිතව; යෙහෙකි, මැනැවි.

භාවාර්ථ: ජාතියෙන් ජාතියෙහි විවිධ කෙලෙසුන් නිසා තොප දැන් විඳිනා දුක් නිසැකයෙන් දැන ගෙන සංසාරයෙන් ගොඩ ඒමට බුදුන් වදාළ පින් ප්‍රකාශ කරමි. එය අසනු මැනැවි.

දන් දීමේ විපාක

106 අ න් හට අලසවැ නොකොට වි ද නය
පි න් මිස අනෙකක් නොකොට ප ද නය
තු න් සිත පිරිසිදු කොට දුන ද නය
උ න් ගිය ගිය තැන ලැබෙයි නි ද නය

අන්වය: අලසවැ අන්හට වීදනය නොකොට පින් මිස අනිකක් පදනය නොකොට තුන් සිත පිරිසිදු කොට දනය දුන උන් ගියගිය තැන නිදනය ලැබෙයි.

පදාර්ථ: අලසවූ, අලස වී ....විදනය, තියම්ය; පදනය, ප්‍රධානය; අන්හට, අනුන් හට;

භාවාර්ථ: අලස කමින් අනුන් ලවා තියමයෙන් නොකොට පින්කම් මිස අනික් ලාභයක් ප්‍රධාන කොට නොගෙණ තුන් සිත පහදා දන් දුන හොත් ගිය ගිය තැනම තිදනය ලැබේ.

විග්‍රහ: මුල-මැද-අග යන සිතිවිල්ල පිළිබඳ තුන් තැන තුන් සිත ය.

107 ඇතුළට වැදූ ගෙය ඇවිලෙන ගින්නේ
පිට තට හළ බඩුමය වැඩ වන්නේ
මෙසිතට ගෙන ලොබ නොවැ දන් දෙන්නේ
තමහට එමැවද මතු පල දෙන්නේ

අන්වය: සුගමයි.

පදාර්ථ: හළු, හැරගන්නා ලද; මතු, අනාගතයෙහි;

භාවාර්ථ: ඇතුළට වැදී ගෙය ද විනාශ කරන ගින්නෙහි දී ගෙන් පිටතට හැරදැමූ බඩු පමණක් රැකේ. මේ සිතට ගෙණ ලෝභ නොවී දන් දෙන්න. තමාට එයම මතු විපාක දෙන්නේය.

108 බුදිනට ගත් බත් පිඩ මිස වෙන නැත
යදිනට දන් දෙව මතු දුක් නොවදිත
මෙමහට ඇත ඉතිරිය දෙමි යන සිත
හැම රට රජ සිරි සැප ලදුවත් නැත

අන්වය: බුදිනට ගත් බත් පිඩ මිස වෙන නැත. මතු දුක් නොවදිත යදිනට දන් දෙව මෙ ම හට ඇත ඉතිරිය දෙමි යන සිත හැම රට රජ සිරි සැප ලදුවත් නැත.

පදාර්ථ: කෑමට ගත් බත් පිඩ හැර වෙන යමක් නැතත් අනාගතයෙහි දුක් නො වැදීමට නම් යදියනට දන් දෙව. මෙ මං හට ඇත සෙස්ස දන් දෙමි යන මේ සිත හැම රටකම රාජ්‍ය ශ්‍රී සැප ලැබුනත් නැත්තේය.

සිල් රැකීමේ විපාක.

109 පි න් නොකරණ දුදනන් බස් නාද
තු න් දෙස් මල දුරුකර සිත පාද
ප න් සිල් නිති අටසිල් රැකැ පෝද
ඉ න් මොක් පුර පැමිණෙවු නොවැ බාද

අන්වය: පහසුයි.

පදර්ථ: දුදනන්, දුර්ජනයන්; නාද, නො අදහා; පාද, පහද; මල, කිලිටි; පෝද, පෝදවසෙහි; බාද, බාධා.

භාවාර්ථ: පින් දහම් නොකරන දුර්ජනයන් ගේ බස් විශ්වාස නොකොට ලෝභ-ද්වේෂ-මොහ යන තුන් දෙස් මල දුරුකැරැ සිත පහද නිතර පන්සිල් පෝ දවසෙහි අටසිල් රැක ඒ පිනින් බාධාවක් නොවැ නිවන් දකිවු.

110 ලොල් සිත මුල් සිඳ නිති තැත් සිති නේ
සි ල් පිරිසිදු කොට සඳරැස් ලෙසි නේ
ව ල් රකිණා සෙමරක මෙන් රකි නේ
ක ල් නොයවා ඉන් මොක් සිරි ලබ නේ

අන්වය: ලොල් සිත මුල් සිඳ නිති තැත් සිතිනේ සිල් සඳ රැස් ලෙසිනේ පිරිසිදු කොට වල් රකිනා සෙමරක මෙන් රකිනේ ඉන් කල් නොයවා මොක් සිරි ලබනේ.

පදර්ථ: ලොල් සිත, ලෝබ සිත; මුල් සිඳ, මුලින් නසා; තැත්, උත්සාහ; සඳරැස්, චන්‍ද්‍රරශ්මිය; වල්, වලිගය; සෙමරක මෙන්, සෙමර දෙනක සේ.

භාවාර්ථ: ලොභය මුලින් සිඳ දමා උත්සාහ වත් සිතින් සඳ කැළුම් මෙන් පිරිසුදු ලෙස සෙමර දෙනක් වල්ගය රකිනා සේ ආදරයෙන් සිල් රකින්න. ඉන් ඉක්මණින් නිවන් දකින්න.

භාවනා කිරීමේ විපාක.

111 වෙත්වා සව්සත සැම කල් නිදු කි
ප ත්වා සැපතට රෝදුක් වැළැ කි
යෙත්වා සමගිවැ නිවණට මුනි කි
මෙත්බා වන නම් වැඩි පින් කම කි

අන්වය: සව්සත හැම කල් නිදුක් වෙත්වා රෝදුක් වැළැකී සැපතට පත්ව සමගිවැ මුනි කී නිවණට යෙත් වා මෙත් බාවනා නම් වැඩි පින් කමකි.

පදාර්ථ: පත්වා, පත් වෙත් වා; මෙත් බාවන, මෛත්‍රී භාවනා;

භාවාර්ථ: සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා — සුවපත් වෙත්වා — සමගි සම්පන්නව බුදුන් වදාළ නිවනට පැමිණෙත්වා යි මෛත්‍රී භාවනා කිරීම උසස් පින් කමකි.

112 ය හ ප ත නො සිතන සැටි මේ   දනයා
කි පි ස ත උතුනට දෙති වේ   දනයා
හැ ම ස ත වෙත කළ මෙත් බා   වනයා
සැකනැත සග මොක් සැප සා   දනයා

අන්වය: මේ දනයා යහපත නොසිතන හැටි කිපි සත උතුනට වේදනයා දෙති හැම සතවෙත කළ මෙත් බාවනයා සග මොක් සැප සාදනයා සැක නැත.

පදාර්ථ: පහසුයි.

භාවාර්ථ: මේ ජනතාව යහපත ගැන නොසිතන හැටි බලන්න. කිපුන සත්ත්වයෝ ඔවුනට වේදනා දෙති. සියලු සතුන් කෙරෙහි මෛත්‍රී වැඩීමෙන් සැක නැතිවැ නිවන් සැප සිඩවේ.

පින්දීමේ විපාක.

113 දෙන් නන් දන දුන් රන් සේ පොළිය   ට
දු න් දුන් සේ තම කළ පින් අනුන   ට
එ න් නේ දියුණුව තියුණුව තම හ   ට
ඉ න් දූන් තුකුසී වවු පින් දීම   ට

අන්වය: පොළියට දන දෙන්නන් දුන් රන් සේ තම කළ පින් අනුනට දුන් දුන් සේ තමහට දියුණුව තියුණුව එන්නේ ඉන් දූන් පින් දීමට තුකුසී වවු.

භාවාර්ථ: පොළියට ධන දෙන්නාත් දුන් රත්රන් සේ තමා කළ පින් දුන් දුන් ආකාරයෙන් දියුණුව තියුණුව තමාට ලැබේ. එනිසා අලස නොවී පින් දෙන්න.

බණ කීමේ විපාක.

114 මු නි ඳු න් බණ පද කරවා පුහු ණූ
දෙස මින් දනහට වඩවා කුළු ණූ
එපිනෙන් නො පැමිණ නිරයට දරු ණූ
ලැබ ගත් මතු සග මොක් සිරි දිවු ණූ

භාවාර්ථ: බුදුරදුන්ගේ ධර්මය පුහුණු කරවි කරුණාවෙන් අනුනට දෙසනා කරමින් ඒ පිනෙන් බිහිසුණු නිරයට නො ගොස් මතු දෙව්-සැප හා මොක් සැප ලබා ගන්න.

බණ ඇසීමේ විපාක.

115 දි ව ම න් මු නි ඳු ට මෙන් මන් තොස වා
බණ දන් නත්හට වැඳ අත් ඔස වා
පද යෙන් ප ද ය ට අදරින් අස වා
එපිනෙන් නිර යට යන මං වස වා

භාවාර්ථ: ජීවමාන බුදුන්ට මෙන් සිත තොස් කර බණ දන්නවුන්ට අත් ඔසවා වැඳ පදයෙන් පදයට ආදරයෙන් අසව. එපිනෙන් නරකයට මඟ වැසේ.

බුදුන් පිදීමේ විපාක

116 දුරු කොට හැම විට සිත ඇති මානේ
ගරු කොට වැඳ වැඳ දුටු තෙක් මානේ
මු නි ඳු ට පුද කළ බත් මල් පානේ
ස ත හ ට සග මොක් මග එම පානේ

භාවාර්ථ: නිතර සිතේ මානය මුදා ඇඳලි බැඳ වැඳ බුදුන්ට බත් – මල් – පහන් පුදව. එපිනෙන් සග මොක් සැප ලැබේ.

117 ඇ ත ලොව වන පස මල් හැම දව සා
කො තැ නක පිදුවත් මුනිඳුන් උදෙ සා
සි ත මෙ විතර පිනටත් නොම සැල සා
ස ත සසරින් ගැලවෙන්නේ කෙලෙ සා

භාවාර්ථ: ලොව හැමදා ම වන පස මල් තිබේ. මුනිඳුන් කොතැනක දී පිදුවත් පින් අත්වේ. මෙ තරම් පිනකට වත් සිත නො මෙහෙයවා සසරින් කෙසේ මිදෙන්ට ද?

ගුණ කීමේ විපාක

118 ලොව ඇත්තන් නුවණින් විමසා දැක
සිත නැත්තන් යයි නොසිතා වෙනස ක
ගුණ ඇත්තන් ගුණ කිම නොවී සැ ක
නුව නැත්තන් පින් කරණ උපායෙ ක

භාවාර්ථ: ලෝකයා නුවණින් විමසා හැඳින තමාට අහිතවත් යයි වෙනසක් නො සිතා ගුණ ඇතියන්ගේ ගුණ කීම නුවණ නැතියන් පින් කරන උපායෙකි.

119 ගොඩ ලම්නේ සත්වග බව දුකි නේ
ගෙන නිවනේ සිටුවන තුටු මති නේ
තු තු රැ ව නේ ගුණ සිහි කළ සිති නේ
නැත විඳිනේ දුක් සසරෙහි ඉති නේ

භාවාර්ථ: සත්ත්වයා සතුටු වූ පමණින් ම බව දුකින් ගොඩ ලමින් නිවනෙහි හෙලන තුනුරුවන් ගුණ සිහි කළහොත් ඉන් සසර දුක් කෙළවර වන්නේය.

120 මුනි පුත් සඟගණ මවුපිය ගුරු වර
ජර පත් කුල දෙටු ගිලනුන් නව සර
රැකසිත් සේ කළ අත් පා මෙහෙ වර
සුව පත් කර සිරි විඳුවයි සුර පුර

භාවාර්ථ: බුද්ධ පුත්‍ර වූ මහා සංඝයා ද මවු පිය ගුරුවර වෘද්ධයන් කුල ජ්‍යෙෂ්ඨයන් ද ශීලවතුන් ද තාපසයන් ද අත් පා මෙහෙවර කරමින් ආරක්ෂා කිරීම ස්වර්ග සැප දෙන පින් කමකි.

121 පින් මිස නෑයන් වන පිහිටක් නැත
උන් දෙන මතු හිමි වන දේකුත් නැත
ඉන් මතු අදහා සිහි කරතොත් සත
අන් කුසලක් නොකළත් මේ දේ ඇත

භාවාර්ථ: පිනක් විනා නෑයන් වන පිහිටක් නැත. නෑයන් විසින් දියහැකි වූ පරලොව පිහිටන දේ කුත් නැතු. ඉන් සත්ත්වයා මතු කාලය ගැන සිත තොත් ඒ සිතිවිලිවලට විශාල පින් කමකි.

122 කුරුපණ අවයෙහි ඉපදුම් නැති කොට
අප මණ සැප සලසා දෙන සත හට
බුදු බණ ලෙස පැවතුම් බැරි මෙතො පට
තිසරණ මිස පිහිටක් නැත සස රට

භාවාර්ථ; හීන දීන අපායෙහි ඉපදීම නැති කොට සතහට නත් සැප සලසා දෙන බුදු බණ ලෙස පැවතිම තොපට බැරි නම් තිසරණ විනා පිහිටක් නැත.

123 පු ර වා සත් රුවනින් මුළු දෙර ණය
ක ර වා පායක් බඹ ලොව පම ණය
බ ඳ වා රන් දද ලා මිණි තොර ණය
දෙනවා ටත් වැඩි පින් බුත් සර ණය

භාවාර්ථ: පොළවේ සත් රුවන් පුරවා බඹලොව පමණ උස පායක් කරවා රන් දද මිණි තොරණ බඳවා දෙනවාටත් වඩා ලොකු පිනක් නම් බුදුන් සරණ යාමයි

124 අ ස මි න් මෙ දහම් අලසව නො සි දේ
පු ර මි න් මෙ සියලු පින් දම් නිබ දේ
කෙලෙසුන් මුල් නො තබා සිත පසි දේ
ලැ බ ග න් සග මොක් මතු දුක් නොවි දේ

භාවය: මෙ දහම් අසමින් අලසව නො ඉඳ මේ සියලු පින් කම් නිතර පුරමින් කෙලෙසුන් සහමුලින් නසා සගමෝක් සැප ලබන්න.

125 සි ග ප ත් එකෙක් පෙර
අනුරුදු තෙරුන් දැක
තම ලත් බතින් දුන්නේ
එකම සැන් දැක
බ ල ව ත් එයින් සුර පති
වීය ඉන් දැක
නැණවත් කරවි දන් පින්
බල මෙයින් දැක

භාවය: පෙර යාචකයෙක් අනුරුඬ හාමුදුරුවන් දැක තමා ලත් කොටසින් එක් කොටසක් දන් දුන්නේය. එයින් දෙව්ලොව ඉන්දක නම් දෙව් පුතෙක්ව උපනි. නුවණැතියෙනි දන් පින් බල මෙයින් බලා පින් කරවු.

126 දව සක් පමණ සිල් රැකි කුලඟනක් පෙ රා
දහ සක් සුරඹ පිරිවරමින් රුවින් ස රා
තවසක් සුරිඳු ළඟ සිරි විඳි නිරන්න රා
විගසක් එසිල් තොර නොකරව් සිතින්ද රා

භාවය: පෙර දවසක් පමණ සිල් රැකි කාන්තාවක් දහසක් සුරඟනන් පිරිවරමින් ශක්‍රයා ළඟ සිරි විඳියි. එබඳු සිල් සිතින් දරා මොහොතක් වත් රකින්න.

127 කෙලෙසුන් සෙරේන් තොර
කර සිතු තනාමය
නිදුකින් ලැබෙයි බඹ
ලොව සැප මනාමය
පුදසුන් නිවන් දෙයි
මරසෙන් දිනාමය
පිනකින් උතුම් පින
නම් බාවනාමය

භාවය: කෙලෙසුන් ගෙන් තොර සිත බඹලොව උපදී. නිවන් සැප දෙයි. පින් අතුරෙන් උතුම් පින බාවනා පිනය.

128 කළ පින් දීම නම් තම සිත සතුටු කොට
බැඳි රන් හිණෙක දෙව්
ලෝකයට නැගු මට
නැඟිපුන් සඳෙකි අට බිය ගිම් නිවී මට
නිති පින් එයින් දෙවු දුටු දුටු දනන් හට

භාවය: තමාගේ සිත තොසකර පින් දීම නම් දෙව්ලෝකයට බැඳි රන් හිණි මගකි. අට බිය ග්‍රිෂ්මය නිවීමට නැංගාවූ පුන් සඳකි. නිතර දුටු දුටු ජනයාට පින් දෙවු

129 දන් දෙන සඳෙහි දෙව්රම් වෙහෙර මුනිඳුට
පින් අනුමෝදන්ව මිනිසෙක් එතන සිට
පින් ලැබ ගතිය වැඩිතරමින් එසිටු හට
ඉන් දුනු නුදුනු කිම අනුමොදනා වට

භාවය: ජේතවනාරාමයෙහිදී බුදුන්ට දන් දෙන වේලාවේ එතන සිටි මිනිහෙක් පින් අනුමොදන් වී දන කතෘවූ සිටුවරයාට වඩා පින් ලැබගත්තේය. එනිසා දුන්නත් නුදුන්නත් පින් අනුමොදන් වන්න.

130 මින් ලබම්යි නො සිතා කිසි උපකර ණ
මුන් සසරින් ගොඩ ලම් යන සිත් කුළු ණ
පින් පව් දෙකම නොවරදවා කිවොත් බණ
ඉන් තොප විඳින සැප
මෙ තෙ කැයි නැත පම ණ

භාවය: මෙයින් කිසි උපකරණයක් නො ලබම් යි සිතා සසරින් ගොඩ ලෑම සඳහා කුළුණෙන් බණ කිවොත් නිවන් සැප ලැබේ.

131 බු දු න් දෙසන බණ
මිහිරෙන් ම සිත තැනි
ප ස න් ව උන් මැඩියෙක්
කැවිටෙකින් ඇනි
එ යි න් විය තිදස ලද
ඉසුරු බෙහෙ විනි
මෙ වන් දහම් ඇසුමට මැලි
නො වව් දැනි

භාවය: බුදුන් දෙසනා ධර්ම මිහිරෙන් සිත සතුටුව බණ ඇසූ මැඩියෙක් කෙවිටකින් ඇනී මැරී සුර පුර බොහෝ ඉසුරු ලැබිය. එනිසා බණ අසා පින් සිදු කර ගන්න.

132 දුක් පත් සතෙක් මුනිඳුන්
වෙත සිත පැහැ දී
එක් දහ ගැබෙක දිය බෙරලිය මලක් පි දී
සක් විති සැපත් ඉන් පන්තිස් වරෙක ලදී
දුක් නැතමෙපුද කරතොත් අකුසලින්මිදී

භාවය: බුදුන් වෙත පැහැදුන දුකට පැමිණි සත්වයෙක් දගැබක දිය බෙරළිය මලක් පුද සක්විති රජ සැප තිස්පස් වරක් ලැබීය එනිසා බුදුන් පුද දුකින් මිදෙන්න.

133 වෙස් සබු මුනිඳු දුක
එක වරෙක වැන්දේ
තිස් එක කපෙක
දුගතිය දුක් නොවින්දේ
තොස් වඩවන සුර නර ඉසුරු වින්දේ
සෙස් ස නැතත් මෙ කුසල් බැරි කුම න්දේ

භාවය: වෙස්සභූ බුදුන් දක වරක් වැඳියෙක් කප් තිස් එකක් දුගතිය නොවැටි සැප වින්දේය. දෙව් මිනිස් සැප වින්දේය. සෙසුදේ බැරි වුවත් මේ කුසල් බැරි ඇයි?

134 කළ හොත් සිල්වතුන් හට නිති වතා වත
දුටු සත් කෙනෙක් වෙති
ඕහට ඉතා හිත
නැණ ඇත් තවුන් සාදන පින් වතා වත
එ මහත් පිනකි දැන
ගනි නොත් හිතා හිත

භාවය: නිතර සිල්වතුන්ට වතාවත් කළොත් ඕ හට දකින ජනයා හිතවත් වෙයි. වතාවත් කිරීම නුවනැත්තෝ කරති. මෙ හොඳ පින් කමකි.

135 පින් කම් කරණ අය ඒ දියුණුවන ලෙස
මන් සත් තොසින් එහි
ගුණ කියන ඇති ලෙස
උන් උපනුපන් තැන
පැතිරෙයි ලොව ය සස
පුන් සඳ පහන් වූ මෙන් අදහව මෙ බස

භාවය: පින්කම් කරන අයගේ ඒ අදහස දියුණුවන ලෙස ගුණ කියව එයින් කීර්තිය පැතිරේ. මේ බස විශ්වාස කරව.